# වධහිංසාවට එරෙහි එක්සත් ජාතීන්ගේ කමිටුවට ITJP විසින් ඉදිරිපත් කරනු ලබන ලියැවිල්ල

**2016 ඔක්තෝබර් 17**

W ITJPSL.COM
E ITJPSL@GMAIL.COM

EXECUTIVE DIRECTOR:
YASMIN SOOKA

**සත්‍යය හා යුක්තිය සඳහා වන ජාත්‍යන්තර ව්‍යාපෘතිය (ITJP) සහ තොරතුරු රැස් කිරීම/ ලේඛන ගත කිරීම පිළිබඳ පසුබිම**

2013 දෙසැම්බරයේ ITJP ය පිහිටුවන ලද්දේ ශ්‍රී ලංකාවේ සිවිල් යුද්ධයේ අවසාන අදියර වූ 2009 දීත් ඉන් අනතුරුවත් යුද අපරාධ සහ මානව වර්ගයාට එරෙහි අපරාධ පිළිබඳව එළි වෙමින් ආ සාක්ෂි සම්බන්ධයෙන් දැක්වුනු ප්‍රතිචාරයක් ලෙසිනි. ව්‍යාපෘතිය එහි අධ්‍යක්ෂිකා සංක්‍රාන්තික යුක්ති විශේෂඥ යැස්මින් සූකා ගේ මග පෙන්වීමෙන් යුත් මානව හිමිකම් පදනම යටතේ පරිපාලනය කෙරේ. පැරණි යුගෝස්ලාවියාව සඳහා වූ විනිශ්චය සභාවේ හිටපු අභිචෝදකයන්ගෙන් ද, එක්සත් ජාතීන්ගේ සංවිධානයේ, සියරා ලියෝනයේ විශේෂ අධිකරණයේ සහ ජාත්‍යන්තර අපරාධ අධිකරණයේ වැඩ කිරීමෙන් ලිංගික ප්‍රචණ්ඩතා සහ වධහිංසා පිළිබඳ විමර්ශන අරබයා පොදුවේ දශක ගණනාවක අත්දැකීම් ගොනුකොට ගත්තාවූත්, මේ කමිටුවේ අරමුණට අදාළ ශ්‍රී ලංකාවේ පරීක්ෂණ සම්බන්ධ ප්‍රත්‍යක්ෂ අත්දැකීම් ඇත්තාවූත් නීතිවේදීන්ගෙන් ද ITJP කණ්ඩායම සමන්විත වේ.

ශ්‍රී ලංකාවේ යුද්ධයේ අවසාන භාගයේ සිදු කරන ලද යුද අපරාධවලට මෙන්ම පශ්චාත් යුද සමයේ ලිංගික ප්‍රචණ්ඩතා සහ වධ හිංසා වලට අදාළ සාක්ෂි නෛතික දෘෂ්ටි කෝණයකින් යුතුව රැස් කිරීමේත්, ලේඛනගත කිරීමේත් විශේෂඥතාවක් ITJP උසුලයි. මෙය අපේ වෛද්‍ය සහකරුවන් ගේ ව්‍යවහාරික ප්‍රවේශයට අනුපූරකයක් වෙයි. මානව හිමිකම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ මහ කොමසාරිස් කාර්යාලය (OHCHR) විසින් 2014-2015 පවත්වන ලද ශ්‍රී ලංකාව සම්බන්ධ විමර්ශනය (OISL) සඳහා සමයේ යුද අපරාධ සහ පශ්චාත් යුද සමයේ ලිංගික ප්‍රචණ්ඩතා සම්බන්ධ සාක්ෂි සපයා දීමෙන් ITJP එම විමර්ශනයට ද සහාය වී ඇත[1]. ITJP ගවේෂකයන් මේතාක් මූලික වශයෙන් කටයුතු කර ඇත්තේ වධහිංසාවට හා ලිංගික ප්‍රචණ්ඩතා වලට ගොදුරුව පිටුවහලේ සිටින වින්දිතයන් කේන්ද්‍ර කරගනිමින් රටින් පිටත සිටය. ඒ, යුද ගැටුම් පැවති උතුර සහ නැගෙනහිර වෙසෙන වින්දිතයන් සහ ඔවුන්ගේ පවුලේ සාමාජිකයන් අනතුරේ නොහෙලා ශ්‍රී ලංකාව තුල වැඩ කිරීමට පවතින ආරක්ෂක තත්වය අපට ඉඩ සලසන්නේ නැති හෙයිනි. සාක්ෂිකරුවන්ගෙන් පළිගැනීම පිළිබඳව උතුරේ හා නැගෙනහිරේ ක්‍රියාධරයන් අපට අනතුරු අඟවා තිබේ. ITJP තම ගවේෂකයන් නම් කොට නැත්තේ රහසිගත භාවය ආරක්ෂා කිරීම සඳහා මෙන්ම තමන්ට මුණ ගැසෙන සාක්ෂිකරුවන් සහ ශ්‍රී ලංකාවේ වෙසෙන ඥාතීන් ද රැක ගැනීමේ ආරක්ෂක පියවරක් ලෙසිනි. මේ තත්වය නිවැරදි කර ගැනීම සඳහා ශ්‍රී ලංකාවේ රජය සහ ජාත්‍යන්තර ප්‍රජාව තව දුරටත් පියවර ගැනීම තීරණාත්මක වෙයි.

නිදහස් කර කෙටි කලකින් ශ්‍රී ලංකාව හැර යන වින්දිතයන්ගෙන් සාක්ෂි ගොනුකොට ලේඛන ගත කිරීම ITJP විසින් සිදු කෙරේ. සමහර අවස්ථාවලදී, පීඩිතයන් විසින් පෙන්වා දී ඇත්තේ ශ්‍රී ලංකාව හැර යන ලෙස ඔවුන් සිරකොට තබා ගත්තවුන් තමන්ට සෘජුවම අනතුරු ඇඟවූ බවය. යුරෝපයට පැමිනි විගස ITJP විසින් සම්මුඛ පරීක්ෂණයට ලක් කරන ලද වින්දිතයෝ මහත් ක්ෂතියෙන් පීඩා විඳිති. සමහර අවස්ථාවලදී, වධහිංසාවෙන් ලත් ලේ ගලන තුවාල මෙන්ම අලුත් කැළැල් ද ඔවුන්ගේ සිරුරේ දකින්නට ලැබුනි.

**ක්‍රමවේදය**

සිදුවීම් වල අනුපිළිවෙල සහ අදාළ විස්තර තහවුරු කරගැනීමටත්, ඔවුන්ගේ කතාව විභාග කොට සනාථ කරගැනීමටත් ITJP ගවේෂකයෝ වින්දිතයකු සමග දින කිහිපයක් ගත කරති. විශ්වාසවන්ත පරිවර්තකයකු සමග මෙය සිදු කෙරෙන්නේ සුරක්ෂිත පරිසරයකදීය. වෛද්‍ය හා නෛතික සාක්ෂි, අපක්ෂපාතී විශේෂඥයන්ගෙන් ලබාගන්නා ව්‍යවහාරික සහ මනෝවෛද්‍ය වාර්තා රැස්කොට අමුණන්නා සේම, රඳවා තබා ගැනීම සම්බන්ධව ජාත්‍යන්තර රතු කුරුස සංවිධානයේ ලියුම්, ශ්‍රී ලංකා රජයේ පුනරුත්ථාපන වැඩසටහනින් මුදා හැරීමේ සහතික, සංක්‍රමණය සඳහා වන ජාත්‍යන්තර සංවිධානයේ හැඳුනුම්පත් සහ ඡායාරූප යනාදිය ද ඇතුලත් කිරීමට ITJP ගවේෂකයන් විසින් වගබලාගෙන තිබේ. සෑම සාක්ෂිකරුවකුගේම ප්‍රකාශන තහවුරු කෙරෙන සාක්ෂි වලට අදාළ ලිපිගොනු වල අංග සම්පූර්ණ බව එමගින් සහතික කෙරේ.

1“Report of the OHCHR Investigation on Sri Lanka (OISL)”, A/HRC/30/CRP/CRP.2, Advance Version, 16 September 2015.

යුද්ධයේ අවසාන භාගයේ අත්දැකීම සම්බන්ධයෙන් ප්‍රශ්න කරනු ලබන වින්දිතයන් මෙන්ම ඔවුන්ගේ පසුබිම ද පිළිබඳව ඇගැයීමක් ලබාගැනීම සඳහා ITJP සැලකිය යුතු කාලයක් මිඩංගු කරයි. එමගින් ඔවුන්ගේ විශ්වසනීයත්වයත්, ප්‍රචලිතව පවත්නා ක්ෂතිය හමුවේ ඔවුන් ඉන්නා මානසික තත්වයත් පිළිබඳ තක්සේරු කිරීමට එමගින් ඉඩ සැලසේ. රඳවා තබාගන්නා ලද ස්ථාන පිළිබඳ සවිස්තරාත්මක තොරතුරු එක්රැස් කරගනු ලැබේ. මෙය ඉතා වැදගත් වන්නේ එම ස්ථාන තවමත් රහසිගත නිසාය. රඳවාගෙන ප්‍රශ්න කිරීමට යොදාගත් කුටි වල ස්වභාවය, පැහැරගැනීමේ සහ නිදහස් කිරීමේ විධික්‍රම සහ පවුලේ සාමාජිකයන්ට එරෙහිව දිගටම සිදුකෙරෙන පලිගැනීම් ආදී විස්තරද ඇතුලත් වේ. මීට අමතරව, අපරාධකරුවන් ගේ ඡායාරූප අඩංගු දිනෙන් දින වර්ධනය වන දත්ත ගබඩාවක් ද ITJP සතුය. මෙය හඳුනාගැනීමත් සාක්ෂි තහවුරු කරගැනීමත් සඳහා ප්‍රයෝජනයට ගනු ලැබේ. වධහිංසනය සහ ලිංගික ප්‍රචණ්ඩතා සම්බන්ධයෙන් වගකිව යුතු බවට චෝදනා නැගෙන අපරාධකරුවන් සහ අණ දෙන්නන් හඳුනාගැනීම සම්බන්ධයෙන් සැලකිය යුතු ප්‍රගතියක් අත් කරගෙන තිබේ.

**ලේඛනගත කිරීම සහ ප්‍රකාශන**

යුද්ධය අවසන් බව නිල වශයෙන් ප්‍රකාශයට පත්වූ 2009 මැයි මාසයේ පටන් සිදුකරන ලද අපරාධකාරී කෙලෙසීම් සම්බන්ධයෙන් 2013 සිට ITJP විසින් යුද්ධයෙන් සහ/ හෝ වධහිංසාවෙන් දිවි බේරාගත් 219 දෙනකුගේ සම්මුඛ පරීක්ෂණ පවත්වා තිබේ. ඕලන්දය, ස්විට්සර්ලන්තය, ප්‍රංශය, බ්‍රිතාන්‍යය, නෝර්වේ, ජර්මනිය, මැලේසියාව, ඉන්දියාව සහ ඔස්ට්‍රේලියාව ඇතුලු තවත් රටවලදී, ITJP සාක්ෂිකරුවන් සමග සම්මුඛ පරීක්ෂණ පවත්වා තිබේ. ඊට අමතරව තවත් ශ්‍රී ලාංකිකයන් 92 ක් සම්බන්ධ ලියකියවිලි (ප්‍රකාශන, දේශපාලන රැකවරණ ගොණු සහ/ හෝ වෛද්‍ය නෛතික වාර්තා) අප සතුව ඇත.

මේ සාක්ෂි සටහන් සහ ඒවා තහවුරු කෙරෙන ආධාරක කරුණුද මත පදනම් වෙමින්. පැහැරගෙන යාම, වධහිංසනය සහ ලිංගික කෙලෙසීම් වලට අදාළ වාර්තා තුනක් (2014 මාර්තු, 2915 ජූලි, 2016 ජනවාරි) ITJP විසින් ප්‍රසිද්ධියට පත් කර ඇත[2]. ඊට අමතරව, සුදු කොඩි යටත්වීම් පිළිබඳ අන්තර්ජාල වාර්තාවක් 2014 මැයි මාසයේත්, යුරෝපයේ පිටුවහලේ ඉන්නා වින්දිතයන්ගේ අදහස් සැලකිල්ලට ගනිමින් සම්පාදිත ශ්‍රී ලංකාවේ සංක්‍රාන්තික යුක්ති ක්‍රියාදාමය පිළිබඳ සමූපදේශන වාර්තාවක් 2016 ජූනියේදීත් ITJP විසින් ප්‍රකාශයට පත් කරන ලදී[3]. මේ සම්බන්ධයෙන් ගත් කල, බ්‍රිතාන්‍යය, නෝර්වේ, ස්විට්සර්ලන්තය සහ ප්‍රංශය යන රටවලට පැමිණ සිටින අවසාන යුද්ධයෙන් දිවි ගලවා ගත්තවුන් සහ පශ්චාත් යුද සමයේ රඳවා ගැනීම් වලට ගොදුරු වූ පිටුවහල් 75 දෙනකු සමග බාහිර විමසුම් වැඩසටහනක් ITJP විසින් මේ වසරේ පවත්වා තිබේ[4]. සෑම අයකුම සමග සම්මුඛ සාකච්ඡා පවත්වන ලද්දේ පරිවර්තක සහායෙන් රහසිගත අයුරිනි. එයින් 73%ක් යුද්ධයෙන් පසු ආරක්ෂක අංශ වල වධහිංසාවට ගොදුරු වූවන්ය. 54% ක් ලිංගික දූෂණයට හෝ වෙනත් ආකාරයක ලිංගික ප්‍රචණ්ඩතා වලට ගොදුරු වී තිබේ. 44%ක් වාර්තා කළ පරිදි පවුලේ ඥාතියකු වධහිංසාවට ලක් වී තිබේ. සමහර අවස්ථාවල ඇතැම් පවුල්වල පරම්පරා කිහිපයක්ම වධ හිංසා විඳ ඇත. පුනරුත්ථාපන කාර්යාවලිය ආරම්භ කිරීමට අවශ්‍ය වෛද්‍ය හෝ සමාජ සත්කාරය, විශේෂයෙන්ම බ්‍රිතාන්‍යයේ දී, වින්දිතයන්ට ලැබී නැති බව විමර්ශනයේදී දැනගන්නට ලැබුනි. බොහෝ දෙනා සියදිවි නසාගන්නා මානසිකත්වයෙන් පෙලුනු අතර, ප්‍රතිකාර නොකළ යුද තුවාල සහිතව සිටියහ.

---

2 (a) "An Unfinished War: Torture and Sexual Violence in Sri Lanka 2009 – 2014", Yasmin Sooka, The Bar Human Rights Committee of England and Wales and the International Truth & Justice Project, Sri Lanka, March 2014.
(b) "A Still Unfinished War: Torture and Sexual Violence in Sri Lanka 2009 – 2015", International Truth and Justice Project Project, July 2015.
(c) "Silenced: Survivors of Torture and Sexual Violence in 2015", ", International Truth and Justice Project Project, January 2016.

3 Copies of all reports are available on our website, www.itjpsl.com

4 Forgotten: Sri Lanka's exiled victims, International Truth and Justice Project Project, June 2016.

## 1 කොටස: වධ හිංසා හා අනිකුත් කුරිරු, අමානුෂික හෝ අවමාන සහගත දඬුවම් කිරීම් වලට එරෙහි සම්මුතිය දිගටම උල්ලංඝනය කිරීම සම්බන්ධයෙනි

### හැඳින්වීම

වධ හිංසා හා අනිකුත් කුරිරු, අමානුෂික හෝ අවමාන සහගත ක්‍රියා හෝ දඬුවම් කිරීම් වලට එරෙහි සම්මුතිය ශ්‍රී ලංකාවේ රජය සහ එහි ආරක්ෂක අංශ විසින් උල්ලංඝනය කිරීමේ ඉතිහාසය මෙම ආයතනයට ලබාදී තිබෙන වාර්තා සහ ප්‍රකාශන මහත් රාශියේ අඩංගු සාක්ෂි මගින් වසර ගණනක් තිස්සේ මනාසේ ලේඛන ගතකොට තිබේ.

මේ උල්ලංඝන සිදු කරන ලද්දේ එල්ටීටීඊ යේ පරාජයෙන් දශක ගණනාවක යුද්ධයක් අවසන් වූ සන්දර්භයක යුද්ධයෙන් පසු සංහිඳියා ප්‍රතිපත්තියක් අනුගමනය කරන බවට හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ පොරොන්දු දී තිබියදීය. යුද්ධය අවසන් වී බොහෝ කලක් තිස්සේත්, හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂගේ පාලන තන්ත්‍රය විසින් දෙමළ ප්‍රජාවට එරෙහිව පැතිරුනු, ක්‍රමානුකූල කෙලෙසීම් රටාවක් පවත්වාගෙන යන ආකාරය මානව හිමිකම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ මහ කොමසාරිස් කාර්යාලය (OHCHR), එක්සත් ජාතීන්ගේ විශේෂඥ මණ්ඩලය සහ ITJP ද ඇතුළු ජාත්‍යන්තර සංවිධාන ගණනාවක්ම විසින් මැනවින් ලේඛනගත කොට තහවුරු කර තිබේ.

2015 ජනවාරියේදී ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන යටතේ නව රජයක් බලයට පත්වූයේ අලුත් තන්ත්‍රයක් පිලිබඳ බලාපොරොත්තු සහ පොරොන්දු කැටුවය. ප්‍රජාතන්ත්‍රවාදී අයිතිවාසිකම් පදනම් කොටගත් නව සංස්කෘතියක් ගොඩනැගීම සඳහා නව රජයේ කැපවීම තිබුනද, දශක ගණනාවක් තිස්සේ තහවුරු වූ දණ්ඩ මුක්තියෙන් ඔද වැඩුනු කෙලෙසීම් දිගටම සිදු කෙරුනි. උතුරු නැගෙනහිර හමුදාකරණය කොට ඇති මේ ආරක්ෂක රාජ්‍යයක උරුමය නිසා ශ්‍රී ලංකාවේ ආරක්ෂක අංශ සහ ඒ විසින් ඇතිදැඩි කරනු ලබන දෙමළ අතුරු හමුදා කල්ලි මගින් දෙමළ ජනතාවට එරෙහිව තල ගණනාවක දියත් කරනු ලබන උල්ලංඝන හේතුවෙන් පලදායී පුළුල් සංහිඳියා ව්‍යාපෘතියකට ඇති ඉඩකඩ අනතුරට ලක්වී තිබේ. සංහිඳියාවට අදාළව ලබා ඇති සීමිත ප්‍රගතිය මීට දෙස් දෙයි[5].

දිගටම කරනු ලබන හිරිහැර සහ බියවැද්දීම්, සුදු වෑන් පැහැරගැනීම සහ එල්ටීටීඊය සමග පහල මට්ටමේ සම්බන්ධයක් තිබුනු බවට හෝ නීත්‍යානුකූල ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලනයක නියැලෙන බවට හෝ සැක කෙරෙන දෙමළ ජනතාවට එරෙහිව සිදුකෙරෙන ලිංගික ප්‍රචණ්ඩතා ඇතුළු වධහිංසා ද මෛත්‍රීපාල සිරිසේන පාලනය යටතේ අපරාධකාරී ලෙසින් තවමත් කෙරෙන කෙලෙසීම් අතරට ඇතුලත් වෙයි. පුද්ගලයන් ඉලක්ක කරගනු ලබන්නේ හිටපු එල්ටීටීඊ ඔත්තුකරුවන් ද ඇතුලත් රහසිගත ජාල මගින් රැස් කරගන්නා ඔත්තු පදනම් කොටගෙනය. මේ ඔත්තු සෙවීම් වල වපසරිය නීත්‍යානුකූල දේශපාලන හා මානව හිමිකම් ක්‍රියාකාරකම් වලක්වාලීම හා සීමා කිරීම දක්වා දැන් පුළුල් වී ඇති බවක් පෙනෙන්නට තිබේ.

ITJP වාර්තාව පදනම් වී ඇත්තේ 2015 සහ 2016 දෙවසරේ රඳවා තබාගනු ලැබූ වින්දිතයන් 33 දෙනකුගේ ප්‍රකාශ ලේඛනගත කිරීමට අමතරව ITJP විසින් වෙනම එක්රැස් කරගන්නා ලද සාක්ෂි වලින් තහවුරු කර ගැනීමෙනි. ප්‍රකාශන විග්‍රහ කළ විට හෙළි වන්නේ සුදු වෑන් පැහැර ගැනීමකින් පසු සිදුකෙරෙන වධහිංසා, ලිංගික දූෂණ සහ වෙනත් ආකාරයේ ලිංගික ප්‍රචණ්ඩතා ඇතුලත් රටාවකි. ලේඛනගත කළ දෑ විශ්ලේෂණය  කළ විට දිස් වන්නේ කප්පම් ගැනීමේ රටාවක් සහ ලාබ ලබන ව්‍යාපාරයක් ලෙස රාජ්‍යය සහ එහි අංගෝපාංග විසින් වධ හිංසනය පවත්වාගෙන යන ආකාරයකි[6]. ප්‍රකාශන වලින් ඉස්මතු වී පෙනෙන්නේ (අ) පැහැරගැනීමට (ආ) ප්‍රශ්න කිරීමට සහ වද දීමට (ඇ) කප්පම් ගෙන මුදා හැරීමට වෙන වෙනම පවත්වාගෙන යනු ලබන කණ්ඩායම් හරහා  ශ්‍රම විභජනයක් සිදු කරමින් මේ කෙලෙසීම් කෙරෙන සංවිධිත ස්වභාවයයි. ඔවුන් විසින් වාර්තා තබා ගැනීම සහ ලේඛනගත කිරීම් සම්බන්ධයෙන් සඳහන් කෙරුමෙන් පෙනී යන්නේ මේ මෙහෙයුම් වල ආයතනගත ස්වභාවයයි. කලින් රඳවාගත් අවස්ථාවලදී දෙන ලද තොරතුරු පිළිබඳව ඇතැම් විටෙකදී වින්දිතයන් ගෙන් විමසා තිබුනි. මෙයින් ඇඟවෙන්නේ නිල සහ නොනිල රැඳවුම් ස්ථාන වලදී එක්රැස් කරගන්නා ලද තොරතුරු අතර සම්බන්ධයයි[7].

---

5 "Sri Lanka: Jumpstarting the Reform Process", International Crisis Group, Asia report Number 278, 18 May 2016. 6 See also "Mercy for Money: Torture's Link to Profit in Sri Lanka", Canadian Centre for Victims of Torture, (forthcoming). 7 By official sites we mean recognised places of detention such as police stations, jails and "rehabilitation" camps. By secret sites we mean places deliberately kept unknown to the detainee. By known sites we mean places like the Wanni Security Forces Headquarters (otherwise known as Joseph Camp – properly Joint Operational Security Force Headquarters].

සුදු වෑන් පැහැරගැනීම් සහ ඒ සමග බැඳී පවතින්නේ, ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් එක්සත් ජාතීන්ගේ සංවිධානය 2015 දී කළ විමර්ශනයෙන්ද (OISL) සනාථ වී ඇති ශ්‍රී ලංකා සන්දර්භයක් තුල සිදුකෙරෙන කෙලෙසීම් රටාවකි. "OISL විමර්ශන කාලපරිච්ඡේදයට පෙර, අතරතුර සහ ඉන් ඔබ්බෙ සිදුවූ සිදුවීම්,"[8] OISL වාර්තාවට ඇතුලත් වෙයි. මේ "අනීතික සහ අත්තනෝමතික අත් අඩංගුවට ගැනීම්" මෙහෙයැවෙන අකාරය සහ ඊට වගකිව යුතු ආරක්ෂක ව්‍යූහ පිළිබඳව වාර්තාවේ විස්තර වෙයි. "මේ කෙලෙසීම් වලට ඉඩ සැලසී ඇත්තේ අත් අඩංගුවට ගැනීම සහ රඳවා තබා ගැනීම සඳහා තවමත් බල පැවැත්වෙන ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත (ත්‍රවැප) මගින් සලසා දී ඇති පුළුල් බලතල වලිනි,"[9] යනු වාර්තාවේ *මූලික සොයාගැනීම්* වල නිගමනයයි. OISL වාර්තාව තව දුරටත් සොයාගත් පරිදි, "ඉහත විස්තර කෙරුනු ආකාරයේ පැහැරගනු ලැබූ හෝ අත්තනෝමතිකව රඳවා තබා ගනු  ලැබූවන් නිරන්තරයෙන් වධහිංසාවලට, සහ/ හෝ අනෙකුත් කෲර, අමානුෂික හෝ අවමාන සහගත සැළකීම් හෝ දණ්ඩන සහ/ හෝ ලිංගික ප්‍රචණ්ඩතා වලට ගොදුරු වී තිබේ. මේ කෙලෙසීම් හුදෙකලාව හෝ කඩින් කඩ සිදුවන්නක් නොව පුළුල්ව විසිරුනු ආකාරයකින් කෙරෙන්නකි"[10]. OISL වාර්තාව මෙසේ තීරණය කරයි; "ශ්‍රී ලංකාව සම්බන්ධ එක්සත් ජාතීන්ගේ විමර්ශනය විසින් රැස් කොට ගන්නා ලද සියලු තොරතුරු වලින් පෙන්නුම් කෙරෙන්නේ ලිංගික ප්‍රචණ්ඩතා යනු හුදෙකලා ක්‍රියා නොව තොරතුරු ලබා ගැනීම, අඩන්තේට්ටම් කිරීම, ගර්හා කිරීම සහ බිය ගැන්වීම සඳහා වධ බන්ධන පැමිණවීමේ දැනුවත් ප්‍රතිපත්තියක් බවයි. පැතිරුනු රඳවා ගැනීමේ ස්ථාන වලදී ඒකාකාර උපකරණ, කාල පරිච්ඡේද සහ ආරක්ෂක හමුදා භාවිතය සහිත එක සමාන රටාවකින් තහවුරු කෙරෙන්නේ මෙය ආරක්ෂක හමුදා විසින් පවත්වාගෙන යනු ලැබූ ආයතනගත ප්‍රතිපත්තියක අංගයක් බවට වන නිගමනයයි."[11]

මීට අමතරව, වධහිංසාව පිළිබඳ එක්සත් ජාතීන්ගේ විශේෂ නියෝජිතගේ මෑත වාර්තාව "පූර්ණ දණ්ඩ මුක්තියක" අවසරයෙන් "සාමාන්‍ය කටයුත්තක් ලෙසින්"  ශ්‍රී ලංකාවේ දිගටම පවත්වාගෙන යනු ලබන වධහිංසාව අවධාරණය කරයි. අපරාධ සම්බන්ධ සැකකරුවන් ගේ සිට "ඇත්තෙන්ම හෝ හිතෙන පරිද්දෙන් ජාතික ආරක්ෂාවට තර්ජනයක්" වන විවිධාකාර උපකුලක වල වින්දිතයන් ද, වගකිවයුතු රාජ්‍යාරක්ෂක ආයතනද වාර්තාව විසින් හඳුනාගෙන ඇත. වඩාත් වැදගත් කරුණක් වන්නේ දිගටම සිදුවන සුදු වෑන් පැහැරගැනීම් සහ තවදුරටත් විමර්ශනය කිරීමේ අවශ්‍යතාව එමගින් පිළිගෙන තිබීමයි[12].

මේ චෝදනා ශ්‍රී ලංකා රජය විසින් ප්‍රතික්ෂේප කර ඇත්තේ, ඒවා "ඇතැම් ජනමාධ්‍ය වාර්තා වල ආ උද්වේගකර චෝදනා මිස ඇති සැටියෙන් කරුණු මත පදනම් නොවූ,"[13] බවට ප්‍රතිචෝදනා නැගීම මගින් මේ නිල විමර්ශන විසින් ගෙනහැර දක්වන සාක්ෂි බැහැර කරමිනි. විශ්වසනීය විමර්ශන පැවැත්වීම සඳහා දේශපාලන අභිලාෂයක් නැති කමත්, ආරක්ෂක අංශයේ පූර්ණ ප්‍රතිසංස්කරණයකින් තොරව මේ උල්ලංඝන නවතින්නේ නැති බව පිළිගැනීමට ඇති අකැමැත්තත් මේ ප්‍රතික්ෂේප කිරීමෙන් පෙන්නුම් කෙරේ. ශ්‍රී ලංකාව තුල පවත්නා තත්වය විශ්වසනීය, ආරක්ෂිත සහ ස්වාධීන පරීක්ෂණයකට ඉඩ සලසන්නේ නැත. එයින් සිදුවන්නේ, මේ ප්‍රශ්නයට පිළිතුරු සැපයීම මග හැර යාම මගින් ආණ්ඩුව තම වගකීම දිගටම නොතකා සිටීමත්, එහි දිගුවක් ලෙසින් දණ්ඩ මුක්තියේ සංස්කෘතිය අඛණ්ඩව පවත්වාගෙන යාමත්ය. මේ අභියෝගයේ කේන්ද්‍රයේ පවතින්නේ වධහිංසාව, පැහැරගෙන යාම, බලහත්කාර අතුරුදහන් කිරීම් සහ ලිංගික ප්‍රචණ්ඩතා වලට පිළිතුරු සොයාගැනීමට ඇති නොකැමැත්ත හා දේශපාලන අභිප්‍රායක් නැති කමය. මෙවැනි බැහැර කිරීම් මගින් සිදුවන්නේ දිගටම පවත්වාගෙන යනු ලබන කෙලෙසීම් සහ දණ්ඩ මුක්තිය සම්බන්ධයෙන් පියවර ගැනීමට ශ්‍රී ලංකා ආණ්ඩුව ජාත්‍යන්තර ප්‍රජාවට දුන් පොරොන්දු වලට ප්‍රතිපක්ෂව යාම සහ ඒවා කඩාකප්පල් කිරීමයි.

මෙවැනි සන්දර්භයක් තුල, සුදු වෑන් සහ වෙනත් පැහැර ගැනීම් සහ ඊට අනුබද්ධ කෙලෙසීම් සම්බන්ධයෙන් OISL වාර්තාවේ එන සොයාගැනීම් සහ වධහිංසාව පිළිබඳ එක්සත් ජාතීන්ගේ විශේෂ නියෝජිත ගේ මූලික නිරීක්ෂණ  තහවුරු කෙරෙමින් ITJP විසින් රැස් කරගත් වාර්තා කෙරේ කඩිනමින් වැඩිදුර අවධානය යොමු කළ යුතුය.

---

8 “Report of the OHCHR Investigation on Sri Lanka” (OISL), op cit. page.71. 9 “Report of the OHCHR Investigation on Sri Lanka” (OISL), op cit. page.220. 10 “Report of the OHCHR Investigation on Sri Lanka” (OISL), op.cit. page.221. 11 “Report of the OHCHR Investigation on Sri Lanka” (OISL), op.cit. para 591. 12 “Sri Lanka: Preliminary Observations and Recommendations of the UN Special Rapporteur Juan E. Mendez, 7 May 2016. 13 “Report of the OHCHR Investigation on Sri Lanka” (OISL), op.cit., page.84

ITJP විසින් ලේඛනගත කොට ඇති සිද්ධීන් විශ්ලේෂණය කළ විට පහත දැක්වෙන රටා සහ ප්‍රවණතා දැකගත හැකිය:

(i) ශ්‍රී ලංකා ආරක්ෂක අංශවල විශේෂ ඒකක විසින් රාජ්‍යයේ සතුරන් ලෙස සලකුණු කොට ඇති දෙමළ පුරවැසියන් දිගටම ගොදුරු කර ගැනීම;
(ii) ශ්‍රී ලංකා ආරක්ෂක අංශ විසින් දිගටම කරනු ලබන කෙලෙසීම් සහ අනීතික කටයුතු;
(iii) ආරක්ෂක අංශ විසින් දිගටම භුක්ති විඳිනු ලබන දණ්ඩ මුක්තිය සහ විශේෂයෙන්ම විධානයේත් පාලනයේත් බලය හසුරුවන වගකිවයුත්තන් ට එරෙහිව පලදායී ස්වාධීන විමර්ශන සිදුකොට නඩු පැවරීම මගින් දණ්ඩ මුක්තිය සම්බන්ධයෙන් පියවර ගැනීමට ශ්‍රී ලංකාවේ රජය මැලි වීම;
(iv) ආරක්ෂක අංශ මැඩ පවත්වමින් තවදුරටත් කෙලෙසීම් සිදුවීම වළක්වාලීම සඳහා ශ්‍රී ලංකා රජය තුල දේශපාලන අභිප්‍රායක් නොමැතිකම;

කෙලෙසීම් වල ක්‍රමවේදයට අදාළව පහත දැක්වෙන රටා ITJP ලේඛනගත කළ සිද්ධීන් වලින් තහවුරු වේ:

(i) ශ්‍රී ලංකා ආරක්ෂක අංශ විසින් සිදුකරන අපචාර විධික්‍රම පෙර පරිද්දෙන්ම පවත්වාගෙන යාම;
(ii) මෙසේ දිගටම කෙරෙන කෙලෙසීම් වළක්වාලීමට සහ අධීක්ෂණයේත්, වාර්තා කිරීමේත් යාන්ත්‍රණ ස්ථාපිත කිරීමට හෝ මේ කෙලෙසීම් අපරාධ ගණයට වැටෙ බවට දැනුවත් භාවයක් ඇති කිරීමේ වැඩ සටහන් ක්‍රියාත්මක කිරීමට හෝ මේ අංශවල විධාන ව්‍යුහය අසමත් වීම. අඩුම වශයෙන් එවැනි ක්‍රියා නොකර ඉඳීමේ ගුණාංගයෙන් යුතුව, රාජ්‍යයේ වගකීම සනිටුහන් කරන පරිදි පැමිණිලි කිරීමේ යාන්ත්‍රණ පිහිටුවීම සහ එම කෙලෙසීම් සම්බන්ධයෙන් පිළියම් යෙදීමේ පහසුකම් සැලසීම මීට ඇතුලත් වෙයි;
(iii) ශ්‍රී ලංකාවේ (නව) දේශපාලන නායකත්වයේ තත්වසම අපරාධ සහායකත්වය සහ කැපී පෙනෙන පරිදි අතීතයෙන් බිඳී එවැනි පුරුදු සදහට නවතා දැමීම සඳහා මැදිහත් වන බවට ප්‍රසිද්ධියේ පිළිගැනීමට දේශපාලන අභිලාෂයක් නැතිකම;
(iv) යුද සමයේ එල්ටීටීඊය විසින් කරන ලද ළමා සොල්දාදුවන් යොදා ගැනීම, බලහත්කාර බඳවාගැනීම් සහ සම්බන්ධ උල්ලංඝන;

ITJP ඉතා ඕනෑකමින් කියා සිටින්නේ ශ්‍රී ලංකා ආරක්ෂක අංශ විසින් සාපරාධී ලෙසින් කලක් තිස්සේ පවත්වාගෙන යනු ලබන අපචාර රටාවක් ද එවැනි කෙලෙසීම් ආයතනගතව ව්‍යාප්ත ලෙසින් දිගටම කෙරෙන බව බැලූ බැල්මට පෙනෙන සාක්ෂි ද මේ ලියැවිල්ලේ සඳහන් වන කෙලෙසීම් වලින් පෙන්නුම් කෙරෙන බවයි.

වධහිංසාවට එරෙහි කමිටුව මෑතදී "ශ්‍රී ලංකාව පිළිබඳ පස්වැනි වාරික වාර්තාවට අදාළ කරුණු ලැයිස්තුවක්" සම්මත කර ගන්නා ලදී; " වධහිංසා සහ අනෙකුත් කෲර, අමානුෂික හෝ අවමාන සහගත සැළකීම් ව්‍යාප්ත වශයෙන්ද, නිරන්තරයෙන්ද සිදු කරන බවට වන චෝදනා"[14] සම්බන්ධයෙන් ද එහි සඳහන් වෙයි. අදාළ පැමිණිලි සම්බන්ධ සංඛ්‍යාත්මක දත්ත සහ වධහිංසා පැමිණවීම සඳහා යොදාගන්නා බවට චෝදනා කෙරෙන මේ ලියවිල්ලේද බෙහෙවින් සඳහන් වන ස්ථාන සම්බන්ධ විමර්ශන පිළිබඳව රජයේ පාර්ශවයෙන් සපයන තොරතුරු වල අඩුවක් ඇති බව කමිටුවට වැටහී ගොස් තිබේ. වධහිංසා කිරීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රජයේ අඩුපාඩු මාලාවක් සහ ඒ පිලිබඳ කනස්සල්ල පලකරන අතරම නිසි ආරක්ෂක වැඩපිළිවෙලක් සකස් කිරීමට අසමත් වීම සහ අනාගතයේ තවත් කෙලෙසීම් සිදු නොවීම වෙනුවෙන් දැනට පවත්නා ප්‍රතිකර්ම තවත් ශක්තිමත් කිරීමට පියවර නොගැනීම ගැන වධහිංසාවට එරෙහි කමිටු වාර්තාවේ සඳහන් වෙයි. මෙම තොරතුරු සැපයීමට ශ්‍රී ලංකා රජයට නැවත වතාවක් අවස්ථාව සලසා දී ඇති අතර රජයේ අවංක භාවයේ දර්ශකයක් ලෙසින් ඒ සම්බන්ධ ප්‍රගතිය සුපරීක්ෂාකාරීව තක්සේරු කෙරෙනු ඇත.

**ITJP විසින් සම්මුඛ පරීක්ෂිත වින්දිතයන්ගේ පැතිකඩ**
**2016 සිද්ධීන්:** 7 (සියල්ලන්ම පිරිමි)
**2015 සිද්ධීන්:** 26 (ගැහැණු 6 පිරිමි 20)

මේ ලියවිල්ලේ දැක්වෙන්නේ පැහැරගැනීම, නීතිවිරෝධී රඳවාගැනීම, වධහිංසාව, ලිංගික ප්‍රචණ්ඩතාව සහ වෙනත් කුරිරු, අමානුෂික සහ අවමාන සහගත සැලකීම් වලට ගොදුරු වූ වින්දිතයන් 33 දෙනකුගේ ප්‍රකාශ සහ ඒවා සනාථ කෙරෙන සාක්ෂිය.

---

14 "List of issues in relation to the fifth periodic report of Sri Lanka", Committee Against Torture, 7 June 2016, CAT/C/LKA/Q/5

සියලුම පීඩිතයන් දෙමළය. පිරිමින් 26 කි, කාන්තාවන් 7 කි. ඔවුහු මේ වනවිට පිටුවහලේ යුරෝපා රටවල් තුනක දිවි ගෙවති. සියලු දෙනාම දේශපාලන රැකවරණ ඉල්ලා ඇති අතර අට දෙනකුට මේ වනවිට යුරෝපා ආගමන විගමන බලධාරීන් විසින් රැකවරණ ලබා දී තිබේ.

මේ බොහෝ සිද්ධීන් වලට ගොදුරු වූ වින්දිතයන්ගේ ප්‍රකාශ වෙනත් සාක්ෂි මගින් තහවුරු කොට තිබේ. ඒ අතර වෛද්‍ය-නෛතික වාර්තා, රෝහල් වල මනෝ චිකිත්සක වාර්තා, ලිපි, කැළැල් වල ඡායාරූප සහ බ්‍රිතාන්‍යයේ රැඳවුම් ස්ථාන වලින් ලබාගත් 35 වැනි නීතියට අදාළ (Rule 35) වාර්තා ද වෙයි. 2015 සිදුවීම් වලදී පස් දෙනකු හැර අනික් හැම දෙනාටම වධහිංසා කළ බව සනාථ වන වෛද්‍ය-නෛතික වාර්තා දැන් ලැබී තිබේ.

මේ සියලු දෙනාටම වධහිංසා පමුණුවා ඇත්තේ වර්තමාන සිරිසේන පාලනය යටතේය. මේ අතර 'පුනරුත්ථාපන' කඳවුරු වලට යැවීම සඳහා භාරනොවූ බවට ඔවුන් පැහැරගත් ආරක්ෂක හමුදා විසින් චෝදනා කරනු ලැබූ, යුද්ධයේ අවසාන මාස කීපයේදී එල්ටීටීඊය විසින් බලහත්කාරයෙන් ළමා සොල්දාදුවන් ලෙස බඳවා ගන්නා ලද්දවුන් ද වෙයි. බොහෝ දෙනකු ශ්‍රී ලංකා රජයේ ආරක්ෂක අංශ අතින් මේ කෙලෙසී ඇත්තේ පළමු වතාවට නොවේ. ඇතැමුන්ට රඳවා තබාගෙන වද දී ඇත්තේ තුන්වැනි වතාවටය.

පැහැරගනු ලැබීමට පෙර මේ වින්දිතයන් අතරින් බොහෝදෙනා දෙමළ ජනතාවගේ අයිතිවාසිකම් වෙනුවෙන් විවිධාකාර සාමකාමී උද්ඝෝෂණ හෝ දේශපාලන ක්‍රියාකාරකම් වල නියැලුණු අයයි. 2015 ජනාධිපතිවරණයේදී සහ මහ මැතිවරණයේදී දෙමළ ජාතික සන්ධානයේ (TNA) සහ දෙමළ ජාතික ජනතා පෙරමුණේ (TNPF) රැස්වීම් වලට සහභාගි වීමේ සිට යුද්ධාවසානය සම්බන්ධ සැමරුම් වලට සහ අතුරුදහන් තම පවුලේ සාමාජිකයන්ගේ ඉරණම දැනගැනීම සඳහා උද්ඝෝෂණ වලට දායක වීම මේ ක්‍රියාකාරකම් අතර වෙයි.

**කෙලෙසීමේ විධික්‍රම**

වධහිංසාවට එරෙහි සම්මුතිය කිහිප වර උල්ලංඝනය කරන අයුරු ITJP විසින් ලේඛනගත කරන ලද කෙලෙසීම් වලින් පිළිබිඹු වන අතර නිවැරදි කාර්ය පටිපාටිය කිසිසේත් අනුගමනය නොකිරීම කැපී පෙනේ. මෙය ප්‍රතික්ෂේප කිරීම් වලට ඉඩ සලසන අතර, මනාසේ මුවහත් කරන ලද දණ්ඩ මුක්ති සංස්කෘතිය එමගින් වඩාත් ශක්තිමත් කරනු ලැබේ.

වින්දිතයන් අත්තනෝමතික ලෙස මුලින්ම පැහැරගැනීම ශ්‍රී ලංකාවේ හැඳින්වෙන්නේ 'සුදු වෑන්' පැහැරගැනීම් යනුවෙනි. වින්දිතයන් විවිධ ස්ථාන වලදී ඩැහැ ගනු ලැබේ. එසේත් නැතිනම් ඔවුන් කැඳවනු ලැබූ ආරක්ෂක අංශයේ ආයතන වලින් (ITJP මේවා හඳුන්වන්නේ සංක්‍රමණ ස්ථාන ලෙසය) තවත් තැනකට ගෙනයනු ලැබේ. 'අත්අඩංගුවට' ගැනීමෙන් පසු සිදුවන්නේ අත්තනෝමතික ලෙස හිරකර තැබීමයි. පැය 24 සිට මාස හයක් හෝ ඊට වැඩි කලක් දක්වාවූ කාල පරිච්ඡේද තුල රඳවා තබා ගත වින්දිතයෝ සිටිති. ඔවුන් රඳවා තබනු ලබන්නේ ප්‍රමාණවත් ආහාර, වතුර හෝ සනීපාරක්ෂක පහසුකම් නැතිව ඉතා කටුක තත්වයන් යටතේය.

ප්‍රශ්න කිරීම්වල ලක්ෂණය නම්, ප්‍රශ්න කරන්නන් විසින් පූර්වයෙන්ම එළැඹි නිගමන සහ චෝදනා සම්බන්ධයෙන් තහවුරු කිරීමක් ඉල්ලා සිටීමයි. වද දෙනු ලබන්නේ කේබල්, පයිප්ප බට, වතුර බැරල් සහ වෙනත් ආම්පන්න වලින් පිරුනු කාමර වල දීය. මෙයින් පෙනී යන්නේ කල් යල් බලා මනාසේ සූදානම් වී සිටි බවකි. තැලීම, කසපහර දීම, සිගරට් වලින් පිළිස්සීම, ගිනියම් යකඩ පොලු වලින් හංවඩු ගැසීම, ජල වධ, පැට්‍රල් හෝ මිරිස් කුඩු දැමූ පොලිතීන් මල්ලක් ඔලුව ඔබා බෙල්ලේ ගැටගසා හුස්ම හිර කිරීම, දෙපයින් එල්ලීම, දෙපතුලට බැට දීම සහ විදුලිය ඇල්ලීම වාර්තා කෙරුනු වධ බන්ධන ක්‍රම අතර වෙයි. මේ චෝදනා ශ්‍රී ලංකාව පිළිබඳ එක්සත් ජාතීන්ගේ වාර්තාවත්, ITJP සහ වෙනත් සංවිධාන විසින් 2015ට පෙර සමයේ ලේඛනගත කරන ලද ඒවාත් සමග සැසඳෙයි. ක්‍රමානුකුල අයුරින් කෙරෙන කෙලෙසීම් වලට අමතරව මුරට සිටින්නන් විසින් හිතුමතේ සහ හිටි අඩියේ ද කෙලෙසීම් කරනු ලැබේ.

**ලිංගික ප්‍රචණ්ඩතා සහ දූෂණය**

ශ්‍රී ලංකා රජයේ ආරක්ෂක අංශ විසින් පශ්චාත් යුද සමයේ පුළුල් ලෙස සිදු කරන පිරිමි දූෂණය සහ වෙනත් ලිංගික ප්‍රචණ්ඩතා සම්බන්ධයෙන් ITJP මවිත වෙයි. කෙසේ වෙතත්, මෙය පිරිමින්ට පමණක්

සීමා වූවක් නොවේ. බොහෝ කාන්තාවන්ද දූෂණයටත් ලිංගික ප්‍රචණ්ඩතා වලටත් ගොදුරු වී තිබේ[15]. පිරිමි දූෂණය කිරීමේ රටාවක් පිළිබඳව කලින් අවුරුදු වලදී තහවුරු කරගෙන තිබුනි[16]. සුදු වෑන් පැහැර ගැනීමට සම්බන්ධ කෙලෙසීම් රටාවේ ලිංගික ප්‍රචණ්ඩතාව ද අත්‍යාවශ්‍ය අංගයක් ලෙස පැවතිනි[17].

මේ ලියවිල්ලේ සඳහන් වන ITJP වාර්තා කළ වධහිංසා සම්බන්ධ 2015-2016 සිද්ධීන් අතරින් 75%ක් පමණ පාහේ පිරිමින්ට ලිංගික අපහරණ සහ දූෂණ කරන ලද අවස්ථාය. මින් බොහෝදෙනා වයස විසි ගණන් වල මුල පසුවන අතර රැඳවුමේදී තමන් ගොදුරු වූ දූෂණයෙන් හා ලිංගික අපහරණයෙන් බලවත් ක්ෂතියට පත්ව සිටිති.

පිරිමි ලිංගික දූෂණය සම්බන්ධ කතාබහ ගැන ශ්‍රී ලංකාවේ පොදුවේ පවතින තහංචිය හේතුකොට ගෙන ඒවා හෙළි කිරීමෙන් වැලකී සිටීමත්, දූෂණය සහ ලිංගික හිංසනය හා බැඳී පවතින ලජ්ජාවත් නිසා මේ පිරිමි දූෂණ ශ්‍රී ලංකාව තුල ලේඛන ගත වී නැති බව ITJP විසින් පෙන්වා දෙනු ලැබේ. පිරිමි දූෂණය සහ පිරිමින්ට එරෙහි ලිංගික ප්‍රචණ්ඩතා සම්බන්ධයෙන් කටයුතු කිරීමේදී රාජ්‍ය නොවන සංවිධාන සහ ක්‍රියාධාරීන් සතු දැනුවත් කමේ මඳ බව ද හෙළිදරව් නොකිරීමේ බරපතල කම තීව්‍ර කොට තිබේ. ලිංගික දූෂණය යන්න ස්ත්‍රීන්ට පමණක් අදාළ දෙයක් ලෙසින් ශ්‍රී ලංකාවේ මානව හිමිකම් සංවිධාන විසින් පිළිගැනීමද සැලකිල්ලට ගත යුත්තකි. මේ ලියැවිල්ලට අදාළ සාක්ෂි වාචක විසින් මේ මතය බැහැර කර ලයි.

ජාත්‍යන්තර අත්දැකීම් හා සසඳා බලන විට පෙනී යන්නේ, මේ පීඩිතයන් ශාරීරික, මානසික සහ සමාජමය වශයෙන් දීර්සකාලීන අනිටු පල විඳවන බව සහ ශ්‍රී ලංකාව තුලත්, ඉන් පිටතත් අවශ්‍ය සහාය සහ පුනරුත්ථාපනය ලැබීමේ ඉඩකඩද නොමැතිව සිටින බවයි.

**පැහැරගැනීම සහ වධහිංසාව පරිභෝජනකරණය සහ ආර්ථික සූරාකෑම - නිදහස් කිරීමට කප්පම්**

ITJP හට හමුවූ වින්දිතයන් අතරින් එක අයකුගේ හැර අනෙක් හැම දෙනාගේම ඥාතීන් රැඳවුමෙන් ගැලවී රටින් පලා යාම සඳහා කප්පම් ගෙවා තිබේ. ඉන් බහුතරයකදී අදාළ වින්දිතයා හෝ ඔහුගේ/ ඇයගේ සහෝදරයකු/ සහෝදරියක හෝ නිදහස් කර ගැනීම සඳහා පය විසින් ඊට ඉහත දී ආරක්ෂක අංශ වලට එක වරක් හෝ කප්පම් ගෙවා තිබේ. මින් බොහෝ අවස්ථා වල නිදහස ලබා දීම සඳහා කප්පම ගනුදෙනු කළ බවට චෝදනා ලබන්නේ ඊළම් ජනතා ප්‍රජාතන්ත්‍රවාදී (EPDP) පක්ෂයයි. නිදහස් කිරීම සඳහා කප්පම් කිරීමේ ගනුදෙනුව සෑම අවස්ථාවකදීම ආරම්භ වන්නේ වධහිංසා කරනු ලැබීමෙන් පසුවය. වින්දිතයන් මුදා හැරීම සඳහා ආරක්ෂක අංශ වලත්, කප්පම් 'බ්‍රෝකර්වරුන්' සහ වෙනත් අයගේත් පාපී දායකත්වය විසින් පෙන්නුම් කරන්නේ ආර්ථික අපරාධ සිදුකරන අපරාධකරුවන්ගේ පුළුල් ජාලයක් ඇති බවයි. මෙය ශ්‍රී ලංකාවේ බලධාරීන් සහ ජාත්‍යන්තර ප්‍රජාව විසින් බරපතල ලෙස විමර්ශනය කළ යුත්තකි.

**පැහැරගැනීමේ, ප්‍රශ්නකිරීමේ සහ වද දීමේ අරමුණු**

පැහැරගනු ලබන්නේ කවුද, ඔවුන්ට වධහිංසා කොට, ප්‍රශ්න කර බලහත්කාරයෙන් පාපොච්චාරණ ලබා ගන්නේ ඇයිද යන්න තීරණය කිරීමේදී අරමුණු කිහිපයක් තිබෙන බව පෙනෙන්නට තිබේ. ඇතැම් අවස්ථාවලදී, එල්ටීටීඊ සම්බන්ධය (කෙලින්ම සහ/හෝ ඥාතියකු) සාධකයකි. වෙනත් අවස්ථාවලදී රජයට එරෙහි විරෝධතා ඇතුළු උද්ඝෝෂණික ක්‍රියාකාරකම් වල යෙදුනු අයද පැහැරගෙන ගොස් තිබේ.

එවන් පැහැරගැනීම්, ප්‍රශ්න කිරීම් සහ වද දීම් වල අරමුණු සම්බන්ධයෙන් ගත් කල, හැම සිද්ධියකදීම පාහේ තමන් නොදන්නා භාෂාවක් වන සිංහලෙන් ලියැවුනු පාපොච්චාරණයකට එසේත් නැතිනම් හිස් කරදාසියකට පීඩිතයන්ගෙන් බලහත්කාරයෙන් අත්සන් ගෙන තිබේ. වධහිංසාවට එරෙහි ප්‍රඥප්තියේ 14 වැනි වගන්තිය උල්ලංඝනය කරන මේ පුරුද්ද ශ්‍රී ලංකාවේ ප්‍රශ්නකරුවන් සහ විමර්ශකයන් විසින් පුළුල් ලෙස ව්‍යවහාරයට ගනු ලබන බව රටපුරා පිහිටි විවිධාකාර රැඳවුම් ස්ථාන වල හිරකොට සිටියවුන් විස්තර කර ඇත. දිගටම පවත්වාගෙන යන මේ පුරුද්ද වධාත් පුළුල් වැඩපිළිවෙලක අංගයක් බවට වන නිගමනය එමගින් තවත් තහවුරු කෙරේ. එසේ ලබාගන්නා පාපොච්චාරණ පසුව ප්‍රයෝජනයට ගනු ලබන්නේ කෙසේදැයි පැහැදිලි නැත. කෙලෙසීම් සහ යුද අපරාධ පිලිබඳ සෑම චෝදනාවක් සම්බන්ධයෙන්ම,

---

16 Testimonies refer to incidents from the end of the war following process of surrender at the frontline, at Manik Farm and other IDP camps, at “rehabilitation” camps, detention sites, army camps and in secret sites, as well as police stations. 17 “Report of the OHCHR Investigation on Sri Lanka” (OISL), op.cit. p.120

සත්‍යය වසං කිරීම සඳහා කරන පුළුල් ව්‍යායාමයක කොටසක් ලෙසින්, සමාන්තර ආඛ්‍යානයක් ගොඩනැගීම සඳහා ශ්‍රී ලංකාවේ බලධාරීන් අතීතයේදී සැලකිය යුතු සම්පත් ප්‍රමාණයක් වැය කළ බව මෙහිදී විශේෂයෙන් සඳහන් කළ යුතුය. මෙය සංක්‍රාන්තික යුක්ති කාර්යාවලි පිළිබඳ පොරොන්දු හා සම්බන්ධ සන්දර්භය තුල ඒ ගැන උනන්දුවක් දක්වන පාර්ශව වලට විශේෂයෙන් වැදගත් වන්නකි.

වින්දිතයන්ගේ ප්‍රකාශන වලින් දැඩිසේ කියා පානු ලබන්නේ අපරාධකරුවන් විසින් අනුගමනය කරන ලද ක්‍රමවේදය වාර්ගිකත්වයක් ඉලක්ක කොටගෙනම කෙරෙන වධබන්ධනයකට සමාන බවයි; එල්ටීටීඊයට එරෙහිව පලිගැනීම සහ දඬුවම් කිරීමද කේන්ද්‍රීය අරමුණු වෙයි. අතුරුදහන් සහ ආගිය අතක් නැතියවුන් මෙන්ම ආරක්ෂක අංශ විසින් අත් අඩංගුවට ගත්දා පටන් ඉන්නා තැනක් නොදන්නා අය පිළිබඳ තොරතුරු සොයන ඥාතීන්ද ඇතුළුව, දේශපාලනික සහ මානව හිමිකම් සම්බන්ධයෙන් උද්ඝෝෂණයේ යෙදෙන අය ඉන් වලකා ලීමද වෙනත් හේතු ලෙස සාක්ෂි වාචක වලින් පෙනීයයි. ඊට අමතරව, බොහෝ වින්දිතයන් ශ්‍රී ලංකාවේ ආරක්ෂක අංශ විසින් යුද්ධයේ අවසාන අදියර වලදී සාමාන්‍ය වැසියන්ට එරෙහිව හිතුමතේ කරන ලද අපරාධ ඇසූ දුටු අය හෙයින් යුද අපරාධ සම්බන්ධ සාක්ෂිකරුවන් සේ ගිනිය හැකිය. ශ්‍රී ලංකා රජයත්, එමගින් ක්‍රියාත්මක කරන යාන්ත්‍රණත් කෙරේ බොහෝ දෙමළ සාක්ෂිකරුවන් තුල විශ්වාසයක් නැතිවාක් මෙන්ම පලිගැනීමට ලක්වීමේ සැබෑ අවදානමක්ද ඇති හෙයින් ඔවුන් නව රජයේ සංක්‍රාන්තික යුක්ති ක්‍රියාදාමයට දායක නොවන බව බව සුපැහැදිලිය. රාජ්‍යයත් එමගින් කෙරෙන සංක්‍රාන්තික යුක්ති ක්‍රියාදාමයත් කෙරේ පීඩිතයන් දක්වන අවිශ්වාසය 2016 ජූනියේ ITJP කළ වින්දිතයන් විමසීමේදී ප්‍රබල ලෙස ඉස්මතු විය.

පැහැරගැනීමට පෙර වින්දිතයන් කිහිපදෙනකුම ආරක්ෂක අංශ වල ඇතැමුන් විසින් හිරිහැරයටත් අඩන්තේට්ටමටත් ලක් කර තිබේ. හමුදාහරණය සඳහා වන ඉල්ලීම් වලට දක්වන විරෝධය කැටි කරගත් එල්ටීටීඊය නැවත මතුවීම පිළිබඳ ආරක්ෂක අංශ සහ රජය අතිශයෝක්තිය කැටි කරගෙන පවත්වාගෙන යන මෙහෙයුම් විධික්‍රමය එමගින් පෙන්නුම් කෙරේ. එයින් පිළිබිඹු වන්නේ ආණ්ඩුවේ ප්‍රතිපත්ති සම්පාදනයේදී දිගටම අනුගමනය කරනු ලබන දැඩි යුදවාදී ප්‍රතිපත්තියේ බලපෑමයි. මෙය ශ්‍රී ලංකාවේ දෙමළ ජනගහනය සමග සබඳතා නැවත ගොඩනගා ගැනීම සඳහා වන කිසියම්ම හෝ අර්ථවත් වර්ධන ඇතිකරගැනීමටත්, සංක්‍රාන්තික යුක්ති ක්‍රියාදාමයක් සමග විශ්වසනීය සම්බන්ධයක් ඇති කරගැනීමටත් බරපතල අභියෝගයක් මතු කරයි.

**දන්නා වධකස්ථාන**

2015 දී ITJP එළි දැක්වූ "තවමත් නිම නොවූ යුද්ධයක්: ශ්‍රී ලංකාවේ වධබන්ධනයෙන් සහ ලිංගික ප්‍රචණ්ඩතාවෙන් ගැලවී ගත්තවුන්" වාර්තාව 2009 සිට 2015 දක්වා කාල පරිච්ඡේදයේදී වධහිංසාවට හෝ වධහිංසා පමුණුවන තැන් වලට සංක්‍රමණය සඳහා හෝ යොදාගත් ස්ථාන 48ක් නම් කොට තිබේ. මේ අතර අභ්‍යන්තරික අවතැන් කඳවුරු, 'පුනරුත්ථාපන' කඳවුරු, CID සහ TID කාර්යාල, හමුදා කඳවුරු සහ පොලිස් ස්ථාන ඇතුලත් වෙයි. වධබන්ධනයටත්, ඒ සඳහා පහසුකම් සැලසීමටත් ආරක්ෂක යටිතල පහසුකම් කොයිතරම් දුරට යොදාගනු ලැබීද යන්න එමගින් මනාව විදහා දැක්වෙයි.

<u>යුද හමුදාව</u>

1) වාවාකච්චේරි හමුදා කඳවුර, යාපනය අර්ධද්වීපය
2) උඩුවිල් හමුදා කඳවුර (උඩුවිල් බාලිකා විදුහල අසල), යාපනය අර්ධද්වීපය
3) උරේලු හමුදා කඳවුර, යාපනය අර්ධද්වීපය
4) කිලිනොච්චි හමුදා කඳවුර (පැරණි එල්ටීටීඊ පොලිස් මූලස්ථානය තුල), වන්නිය
5) ඕර්ස් හිල් කඳවුර, ත්‍රිකුණාමලය
6) වේප්පන්කුලම් හමුදා කඳවුර, වව්නියා දිස්ත්‍රික්කය
7) ඕමන්තෙයි පාසල අසල හමුදා කඳවුර, වව්නියා දිස්ත්‍රික්කය
8) පලාලි හමුදා කඳවුර, යාපනය අර්ධද්වීපය
9) අච්චුවේලි හමුදා කඳවුර, යාපනය අර්ධද්වීපය
10) ඉයක්කච්චි හමුදා කඳවුර, අලිමංකඩ
11) ජෝසප් කඳවුර, වව්නියාව නගරය
12) සම්පත් නුවර කඳවුර, ත්‍රිකුණාමල-මුලතිව් මායිම
13) ත්‍රිකුණාමල නාවික තටාකාංගනය
14) උරුම්පිරායි හමුදා කඳවුර, යාපනය අර්ධද්වීපය
15) පරන්තන් හන්දිය අසල කඳවුර

පොලිස් පරිශ්‍ර

16) ත්‍රස්ත විමර්ශන ඒකකය (TID)/ අපරාධ විමර්ශන දෙපාර්තමේන්තුව (CID) හෙවත් "හතරවැනි තට්ටුව" සහ පාරෙන් එහා පැත්තේ නාවික අංගනය
17) නෙල්ලිඅඩි පොලිස් ස්ථානය
18) බොරැල්ල CID ගොඩනැගිල්ල
19) කොළඹ වරාය පොලිස් ස්ථානය
20) වැල්ලවත්ත පොලිස් ස්ථානය
21) දෙමටගොඩ TID කාර්යාලය/ පොලිස් ස්ථානය
22) කොටහේන පොලිස් ස්ථානය
23) බම්බලපිටිය පොලිස් ස්ථානය
24) හෙට්ටියාවත්ත පොලිස් ස්ථානය
25) නුගේගොඩ CID කාර්යාලය
26) අම්පාරේ CID කාර්යාල
27) ගල්කිස්ස පොලිස් ස්ථානය
28) කල්මුනේ CID කාර්යාලය, අම්පාර දිස්ත්‍රික්කය
29) කලවංචිකුඩි CID කාර්යාලය, අම්පාර/ මඩකලපු මායිම
30) තම්බුලුවිල් හි ඉනියභාරතී ගේ කාර්යාලය, මෙහි CID මෙහෙයුම් සිදු කෙරිනි

"පුනරුත්ථාපන" පරිශ්‍ර

31) නෙල්ලුකුලම් තාක්ෂණික විද්‍යාලය, වව්නියාව දිස්ත්‍රික්කය
32) පම්පමඩු, වව්නියාව දිස්ත්‍රික්කය
33) පූන්තෝට්ටම් සමුපකාර පුහුණු පාසල, වව්නියාව දිස්ත්‍රික්කය
34) රම්බෙයිකුලම් යහපත් එඬේරාගේ කන්‍යාරාමය/ බාලිකා විදුහල, වව්නියාව දිස්ත්‍රික්කය
35) වැලිකන්ද/ සේනපුර කඳවුර, නැගෙනහිර ශ්‍රී ලංකාව
36) කෝවිල්කුලම් මහා විද්‍යාලය, වව්නියාව දිස්ත්‍රික්කය
37) මරදමඩු, වව්නියාව දිස්ත්‍රික්කය
38) ධර්මපුරම් සුබසාධන මධ්‍යස්ථානය
39) වෙල්ලික්කුලම් මුස්ලිම් බාලිකා විද්‍යාලය, වව්නියාව දිස්ත්‍රික්කය
40)පොතානිච්චූර් මුස්ලිම් මහා විද්‍යාලයේ යොවුන් පුනරුත්ථාපන හා පුහුණු මධ්‍යස්ථානය, වව්නියාව දිස්ත්‍රික්කය

සුදු වෑන් පැහැරගැනීම් සඳහා සංක්‍රමණ ස්ථාන ලෙස යොදාගන්නා ලද හමුදා කඳවුරු හෝ පොලිස් ස්ථාන

41) තන්තිරිමලේ හමුදා කඳවුර, වව්නියාව දිස්ත්‍රික්කය
42) ඉරනෛපලෙයි හමුදා කඳවුර, වන්නිය
43) කනගපුරම් හමුදා කඳවුර, වන්නිය
44) කුරුමන්කාඩු කඳවුර, වවුනියාව දිස්ත්‍රික්කය
45) අම්පාරේ ගුවන් හමුදා පාරේ පර්යන්තයකට යාබද ගොඩනැගිල්ල
46) ජ්ලාන්ටන් පොයින්ට්, ත්‍රිකුණාමලය
47) තෙල්ලිප්පලෙයි පොලිස් ස්ථානය, යාපනය අර්ධද්වීපය

අනාථ කඳවුරු

48) මැණික්ෆාම් කඳවුර

2015 ජූලි සිට ITJP විසින් එකතු කරගත් සිද්ධි වලින් සනාථ වන්නේ මේ ස්ථාන වධහිංසනය සඳහා යොදාගෙන තිබෙන ආකාරයයි. මේ තැන් ගණනාවක්ම වධහිංසා කළ බවට චෝදනා කෙරෙන ස්ථාන ලෙසින් වධහිංසාවට එරෙහි එක්සත් ජාතීන්ගේ කමිටුව විසින් ප්‍රකාශයට පත් කළ 'කරුණු ලැයිස්තුව' නම් ලියවිල්ලේ නම් කොට තිබේ. එක්සත් ජාතීන්ගේ ශ්‍රී ලංකාව සම්බන්ධ විමර්ශනයට අදාළව ඒවා පිළිබඳවද සලකා බැලිය යුතුය. මේ ලියැවිල්ලේ එන වින්දිතයන්ගේ ප්‍රකාශ වලින් එකී චෝදනා බොහොමයක් සනාථ කෙරෙනවාක් මෙන්ම, 2015 සහ 2016 වසර වලදී භාවිතා කෙරුනු වෙනත් පරිශ්‍ර ද හඳුනාගෙන තිබේ. 2015 සහ 2016 දී තමන් රඳවාගෙන වධහිංසා කරනු ලැබුවේ වවුනියාවේ පිහිටි ජෝසප් කඳවුරේ දී

(වන්නි ආරක්ෂක සේනා මූලස්ථානය) බවට සැක කරන වින්දිතයන්ගේ සාක්ෂි ITJP විසින් ලේඛනගත කොට තිබේ.

**රහසිගත වධකාගාර**

"මේ වනවිට ශ්‍රී ලංකාවේ කිසිදු රහසිගත රැඳවුම් මධ්‍යස්ථානයක් නැත," යි ආණ්ඩුව විසින් 2016 ජූනියේ ලබා දුන් සංශෝධිත ලියැවිල්ලේ එන සඳහන බරපතල අසත්‍යයක් බවත් එය අභියෝගයට ලක් කළ යුතු බවත් ITJP අවධාරණය කරයි[18]. ඇත්ත කරුණ නම්, ITJP විසින් වාර්තා කෙරුනු 2015 සහ 2016 සිද්ධි අතරින් 29ක් ම පැහැරගැනීමෙන් පසු වින්දිතයන් රහසිගත (එසේත් නැතිනම් පීඩිතයාට හඳුනාගත නොහැකිවූ) වධකස්ථාන වෙත ගෙනයාම පිළිබඳව සඳහන් කරයි. ඉන් සමහර සිද්ධි සිදුවී ඇත්තේ පොලිස් හෝ හමුදා ආයතන වෙත වාර්තා කිරීමෙන් අනතුරුවය. බොහෝ අවස්ථාවලදී අපරාධකරුවන් කර ඇත්තේ වද දීමට ගෙනයනු ලබන්නේ කොහිදැයි වින්දිතයන්ට හඳුනාගත නොහැකි වන පරිදි ඔබ මොබ ගෙන යාමේදී ඇස් බැඳ තැබීමට වග බලා ගැනීමයි. කලින් අවුරුදු වලදී මේ විධි ක්‍රමයම ක්‍රියාත්මක කෙරුණු අයුරු ශ්‍රී ලංකාව පිළිබඳ එක්සත් ජාතීන්ගේ 2015 විමර්ශන වාර්තාවේ මනා ලෙස ලේඛනගත කොට තිබේ. රැඳවුම් කුටි, වැසිකිලි, ප්‍රශ්න කරන කාමර ආදිය පිළිබඳව ප්‍රකාශන වලින් රැස් කරගත් පුළුල් විස්තර වලින් ITJP ට පෙනී යන්නේ ස්ථාන මාලාවක්ම 'වැඩෙහි යොදවා' ඇති බවයි. ආරක්ෂක අංශ වළක්වාලීමේ කිසිදු පරිශ්‍රමයකින් තොරව වධහිංසනය දිගටම පවත්වාගෙන යාමත්, මෙම ස්ථාන දිගටම වද දීම සඳහා පවත්වාගෙන යාමත් විසින් කෙරෙන්නේ ශ්‍රී ලංකාවේ ආරක්ෂක අංශ වලට සලසා දී ඇති දණ්ඩ මුක්තිය වඩාත් පෝෂණය කිරීමයි.

**පවුලේ සාමාජිකයන් බියවැද්දීම**

පැහැර ගැනීම් සහ මුදා හැරීම් වලට පෙරත්, පසුත් ඥාතීහු බියවැද්දීමටත් හිරිහැරයටත් ගොදුරු වෙති. ITJP වෙත ඇති සිද්ධි සංචිතයේ එක් වින්දිතයකුගේ හැරුනු විට අනික් සියලුම පවුල් වල සාමාජිකයන් වින්දිතයා රට හැර පලා ගිය පසු ආරක්ෂක අංශ විසින් ප්‍රශ්න කිරීමට ලක් කර තිබේ. මේ චර්යාව බිය දනවන්නකි. මේ අත්දැකීම් පිළිබඳ විස්තර ITJP විසින් සකස් කළ 2016 ජූලි සහ 2016 ජනවාරි වාර්තාවල එයි. දිගටම කෙරෙන සෝදිසිය සහ බිය වැද්දීම එළිපිට කතා කිරීම තර්ජනාත්මකව වලක්වාලීමක්ද, ශ්‍රී ලංකාවේ තම සමීපතමයන් සමග ළඟ සම්බන්ධයක් පවත්වාගෙන යමින් සිටින පිටුවහල් ප්‍රජාව බියගන්වන්නක්ද වෙයි.

**අපරාධකරුවෝ**

පීඩිතයන්ගෙන් තම අනන්‍යතාව සඟවා තැබීමේ උවමනාවක් අපරාධකරුවන් හට තිබී නැත; මෙයින් පෙනී යන්නේ මේ කෙලෙසීම් හා බැඳී පවතින දණ්ඩ මුක්තියේ තරමයි. සංක්‍රමණ ස්ථාන සහ වධකස්ථාන වලදී පෙන්නුම් කරන බලය, නිල ඇඳුම් යනාදිය ආශ්‍රයෙන් අපරාධකරුවන් කිහිපදෙනකුම යුද හමුදා සහ පොලිස් ව්‍යුහ වලට අයත් ලෙසින් හඳුනාගත් බව වින්දිතයන් ගේ ප්‍රකාශන වල සඳහන් වෙයි. එක් අවස්ථාවක ප්‍රශ්නකරු මහින්ද රාජපක්ෂට අතට අත දෙන ඡායාරූපයක් දකින්නට තිබුනි. වෙනත් අවස්ථාවකදී වින්දිතයාට සිංහල මදක් වැටහෙන බව හැඟී ගිය විට ඔවුහු  කතා බහ ඉංග්‍රීසියට හරවා තිබේ. මෙයින් පැහැදිලි වන්නේ ඉහල නිලධාරීන් මේ කෙලෙසීම් වලට සම්බන්ධ බවය.

**'පුනරුත්ථාපන' වැඩ සටහන**

අතීතයේ කෙරුනු 'පුනරුත්ථාපන' ක්‍රියාදාමයේ අනිවාර්ය අංගයක් ලෙස වධහිංසාව සිදුකෙරුනු ආකාරය පිළිබඳ චෝදනා සැලකිල්ලට ගත් කල ශ්‍රී ලංකා ආණ්ඩුවේ 'පුනරුත්ථාපන' වැඩසටහන තවමත් පවත්වාගෙන යන බවට වන වාර්තා සම්බන්ධයෙන් ITJP තම සැලකිල්ල යොමු කිරීමට අපේක්ෂා කරයි. මීට අදාළව ගත් කල, 'පුනරුත්ථාපනයේ' දී වධහිංසා කළ බවට පීඩිතයන් චෝදනා කරන සිද්ධි 30 කට වඩා තොරතුරු ITJP විසින් රැස් කොට ඇත. ඉන් අඩක්ම තාවකාලිකව මුදා හැරීමෙන් පසුත් නීතිවිරෝධී ලෙස පැහැරගෙන, සිරකොට, වධහිංසාවට ලක් කොට තිබේ. රහස්‍යභාවයෙන් වැසී තිබෙන 'පුනරුත්ථාපන' වැඩසටහන පිළිබඳව පාරදෘශ්‍ය ලෙසින් කටයුතු කිරීමට ආණ්ඩුව කැමැත්තක් නොදක්වයි. ITJP විසින් සම්මුඛ පරීක්ෂාවට ලක් කරන ලද ගැලවී ගත් වැඩිදෙනකු කියා සිටියේ සිංහලෙන් ජාතික ගීය ගයන්නට ඉගැන්වීම හැර තමන්ගේ පුනරුත්ථාපනයට හෝ අනාගත ජීවිකාව සරි කර ගැනීමට ප්‍රයෝජනවත් යමක් පුහුණු කිරීමට හෝ කිසිත් නොකරන ලද බවයි.

18 CAT/C/LKA/5/Add.1

'පුනරුත්ථාපන' වැඩසටහන සම්බන්ධයෙන් පහත දැක්වෙන ප්‍රශ්නවලට අදාළව තොරතුරු ශ්‍රී ලංකා ආණ්ඩුවෙන් ලබා ගත යුතුය.

i. 2009 සිට මේ වැඩසටහන යටතේ රඳවා තබාගෙන සිටි පිරිමින්, කාන්තාවන් සහ ළමුන්ගේ නිශ්චිත සංඛ්‍යාව ඔවුන්ගේ ලිංගිකත්වය, වයස සහ වාර්ගිකත්වය පිලිබඳ දත්ත වෙන් වෙන්ව දක්වමින් ඔවුන් නිදහස් කළ දිනද සහිතව ලබා දිය යුතුය.

ii. සියලුම 'පුනරුත්ථාපන' කඳවුරු වල නම් සහ පිහිටා ඇති ස්ථාන (මේවා පොදුවේ දන්නා තොරතුරු නොවේ) මෙන්ම, ඒවා ක්‍රියාත්මක වුනු කාල පරිච්ඡේදය. කරුණාකර ඒ කඳවුරු භාරව සිටි හමුදා නායකයන් ගේ නම් සහ නිලය සඳහන් කරන්න.

iii. රැඳවියන්ට වධහිංසා සහ ඇතැම් අවස්ථාවල ලිංගික ප්‍රචණ්ඩතා සිදු කිරීම 'පුනරුත්ථාපන' වැඩසටහනට ඇතුලත් වූ බවට 2013 දී මුලින්ම කෙරුනු චෝදනා සම්බන්ධයෙන් කවර හෝ විභාගයක් පවත්වන ලද්දේදැයි තහවුරු කරන්න.

iv. මේ කඳවුරු වල කෙරුනු වධහිංසා සහ ලිංගික ප්‍රචණ්ඩතා සම්බන්ධයෙන් කිසිවකුට හෝ කවදා හෝ නඩු පවරා ඇතිදැයි සනාථ කරන්න.

v. තවදුරටත් 'පුනරුත්ථාපන' කඳවුරුවල රඳවාගෙන සිටින පුද්ගලයන් ගණන ඔවුන්ගේ ලිංගිකත්වය, වයස සහ වාර්ගිකත්වය පිලිබඳ දත්ත වෙන් වෙන්ව දක්වමින් තහවුරු කරන්න. ඒ කොහේද, කවර කලකටද, ඇයිද?

vi. 'පුනරුත්ථාපන' කඳවුරු වලට තෝරාගැනීම සඳහා භාවිතා කෙරෙන සුපරීක්ෂා ක්‍රියාදාමය මෙන්ම රැඳවියන්ට තමන් කැමති වෛද්‍යවරයකු හා නීතිඥයකු හමුවීමේ ඉඩ සලසා තිබේද යන්නත්, රඳවා තබා ගත් බව හා ස්ථානය වහාම ඥාතීන්ට දැනුම් දෙන ලද්දේද යන්නත් දක්වන්න.

vii. සේවා හෝ අරමුදල් ලබාදීමට හෝ කඳවුරු වලට ප්‍රවේශ වීමට හෝ ජාත්‍යන්තර හා දේශීය රාජ්‍ය නොවන සංවිධාන වලට සහ පෞද්ගලික අංශයට කෙතරම් දුරට ඉඩ දී ඇතිද යන්න තහවුරු කරන්න.

viii. රැඳවුම් මධ්‍යස්ථාන වල රඳවා තබා ගැනීමේ කාලය දක්වන්න. මේ රැඳවුමේ නීත්‍යානුකූල භාවය ස්වාධීන අධිකරණයක් හමුවේ අභියෝග කිරීමට රැඳවියන්ට හැකියාවක් ඇති බවට සහතිකයක් තිබේදැයි තහවුරු කරන්න.

ix. කාන්තා 'පුනරුත්ථාපන' කඳවුරේ සිට රත්මලාන ට්‍රයිස්ටාර් ඇඟලුම් කම්හලට මාරු කර යවන ලද කාන්තාවන්ගේ සංඛ්‍යාව තහවුරු කරන්න. ඔවුන් කී දෙනෙක් තවමත් රැකියාවේ නිරතව සිටිත්ද? පුනරුත්ථාපිතයන්ගෙන් කවර අනුපාතයකට නිපුනතා පුහුණුවක් ලබා දී තිබේද? ඒ කවර ශිල්ප සඳහාද?

x. නිපුණතා පුහුණුව ඇතුළුව 'පුනරුත්ථාපන' වැඩසටහනේ බලපෑම තක්සේරු කිරීම සඳහා කිසියම් ස්වාධීන ඇගැයුමක් කළේදැයි තහවුරු කරන්න.

xi. 2009 ජූනි මාසයෙන් පසු මෙම 'පුනරුත්ථාපන' කඳවුරු වලට ප්‍රවේශ වීමට ජාත්‍යන්තර රතු කුරුස සංවිධානයට ඉඩ සලසා දී තිබූ අවස්ථා නිශ්චිතව දක්වන්න.

xii. 'පුනරුත්ථාපන' ක්‍රියාදාමය තුලදී සිදුකරන ලද වධහිංසා සහ ලිංගික ප්‍රචණ්ඩතා ඇතුළුව නිරපරාදේ රඳවා තබා ගැනීම සහ 'පුනරුත්ථාපනය' සම්බන්ධයෙන් පීඩිතයන්ට වන්දි ඉල්ලා සිටීමට හැකි වන පරිදි කිසියම් යාන්ත්‍රණයක් සකස් කර තිබේදැයි දක්වන්න. දැනට විදේශගතව සිටින පීඩිතයන්ද ඇතුළුව කිසියම් හෝ වින්දිතයකුට වන්දි ගෙවා තිබේද?

## 2 කොටස : ශ්‍රී ලංකා රජයේ ප්‍රකාශන වලට ප්‍රතිචාර

[යොමුව මුල් ලියැවිලි ඡේද අංක හා සැසඳේ]

**1. "ප්‍රඥප්තියේ 19 වැනි වගන්තිය ප්‍රකාර රාජ්‍ය පාර්ශව විසින් ඉදිරිපත් කරන ලද වාර්තා සම්බන්ධයෙන් සලකා බැලීම", උප ග්‍රන්ථය (2016 ජූනි) හි ආණ්ඩුව විසින් මතු කළ ඇතැම් කරුණු වලට ප්‍රතිචාර[19].**

**ඡේදය 4:** "යුද ගැටුම්වලදී ලිංගික ප්‍රචණ්ඩතා වලට එරෙහි ප්‍රකාශනය" රජය විසින් අනුමත කිරීමෙන් අනතුරුව ඒ සම්බන්ධයෙන් අර්ථවත් කිසිවක් ක්‍රියාවේ යොදවා නැත. මෙය හුදෙක් කොටු ලකුණු කිරීමේ අභ්‍යාසයක් පමණක් වූ බවක් පෙනේ.

(අ) **පැහැදිළි උපදෙස්:** "වධහිංසාව, ලිංගික දූෂණය සහ ලිංගික ප්‍රචණ්ඩතා ඇතුළු ජාත්‍යන්තර මානව හිමිකම් නීතිය සහ ජාත්‍යන්තර මානුෂවාදී නීතිය උල්ලංඝනය කිරීම තහනම් බවත්, ඊට වගකිව යුත්තන්ට එරෙහිව පරීක්ෂණ පවත්වා දඬුවම් කරන බවත් ආරක්ෂක හමුදාවල සියලුම අංශ වලට පැහැදිලි උපදෙස් නිකුත් කිරීමට," ශ්‍රී ලංකා ආණ්ඩුව එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් මණ්ඩලයේදී 2015 සම්මත කරගත් හවුල් යෝජනාවෙන්[20] පොරොන්දු විය. ආරක්ෂක අංශ වලට එවැනි උපදේශයක් දීමට ශ්‍රී ලංකා රජය අද දක්වා කිසිදු උත්සාහයක් ගත් බවක් පෙනෙන්නට නැති අතර, එවැනි නිවේදනයක් නිකුත් කර තිබුනත්, එය *පැහැදිලිව* සිදු කොට ඇති බවට විග්‍රහ කළ නොහැකි වන්නේ සෑම සෙබළකු සහ පොලිස් භටයකු මෙන්ම පොදු ජනතාවද දැනුවත් වන පරිදි ඊට පුළුල් ප්‍රචාරයක් දී නැති නිසාය.

(ආ) **සියලු වාර්තා සම්බන්ධයෙන් පියවර ගැනීම:** මීට අමතරව, "ලිංගික සහ ලිංගිකත්වය පදනම් කරගෙන කළ ප්‍රචණ්ඩතා සහ වධහිංසා පිළිබඳ සියලු වාර්තා සම්බන්ධයෙන් පියවර ගැනීමට" එක්සත් ජාතීන්ගේ යෝජනාව ශ්‍රී ලංකා රජයට අනුබල දී තිබේ. මේ වාර්තා සම්බන්ධයෙන් හෝ එහි එන චෝදනා සම්බන්ධයෙන් පියවර ගැනීමට ශ්‍රී ලංකා රජය කිසිදු ක්‍රියාවක් කර නැත.

ශ්‍රී ලංකාවට පැමිණෙන ලෙස විදේශ අමාත්‍ය මංගල සමරවීරගෙන් ලැබුනු ලිඛිත ආරාධනයකට පිළිතුරු වශයෙන්, ITJP ජාත්‍යන්තර විශේෂඥයන්ද ඇතුලත් ස්වාධීන විමර්ශන කණ්ඩායමක් පිහිටුවා ලීම සඳහා සහාය දීමට කැමැත්ත පල කර සිටියේය. ඔහු ITJP ලිපියට පිළිතුරු දුන්නේ නැත. එවැන්නක් සැලසුම් කෙරෙන බවක් ITJP ට පෙනෙන්නට ද නැත.

අලුතින් නවීකරණය කරන ලද ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිසම සම්බන්ධයෙන් ගත් කල, ශ්‍රී ලංකාවෙන් ලැබෙන වාර්තා වලින් පෙනී යන්නේ, පැහැරගැනීම්, නීතිවිරෝධී රඳවා ගැනීම් සහ ලිංගික ප්‍රචණ්ඩතා වලින් පීඩාවට පත් වූවන්ට එමගින් යම් සහනයක් උදාවේයයි බලාපොරොත්තුවක් පැවතියද, විශ්වසනීය අභ්‍යන්තර විමර්ශන ශක්‍යතාවක් හෝ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීමේ සැලසුමක් හෝ කොමිසමට නැති බවට හැඟීමක් ඇතිවාක් මෙන්ම, සංවිධානය අපකීර්තියට පත් රාජපක්ෂ සමයේ වැඩ කළ කාර්ය මණ්ඩලයේ බොහෝ දෙනකු තවමත් සේවයේ යොදවාගෙන සිටින බවය. ඇතැම් ස්ථාන (යාපනය, මුලතිව් සහ කොළඹ) වලදී පැමිණිළි භාරගනු වෙනුවට ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිසම විසින් ඒවා පොලිසියට යොමු කරනු ලබන බවටද ITJP වෙත රට තුල වින්දිතයන්ගෙන් සහ සංවිධාන වලින් වාර්තා ලැබී තිබේ. ආරක්ෂක අංශම අපරාධකරුවන් ලෙස චෝදනා ලබන අවස්ථාවලදී මෙය බරපතල ප්‍රශ්නයකි. අඩුම තරමින් සාක්ෂි කරුවන් ආරක්ෂා කිරීම සම්බන්ධයෙන් ගත් කල මෙය දැවැන්ත ප්‍රශ්නයකි. මේ විශ්වාස සහ ප්‍රතිපත්ති හමුවේ "මෑත සිදුවූ ව්‍යවස්ථා සංශෝධන සහ කොමිසම ප්‍රතිසංවිධානය සම්බන්ධයෙන් සැලකිල්ලට ගත් කල[21]" මානව හිමිකම් කොමිසම ශ්‍රී ලංකා රජය අපේක්ෂා කරන ආකාරයෙන් A ශ්‍රේණිය හිමිකරගැනීමට ඇති ඉඩකඩ ඉතා අඩුය. විශ්වසනීය නායකත්වයක් යටතේ කොමිසම ප්‍රතිසංවිධානය කිරීම ප්‍රමාණවත් නොවේ; එම තත්වය කරා ලඟා විය හැකි වන්නේ වගවීම නගා සිටුවමින් දණ්ඩ මුක්තිය සම්බන්ධයෙන් පියවර ගැනීමෙන් සහ පීඩිතයන්ට යුක්තිය කරා ප්‍රවේශ වීමට පහසුකම් සැලසීම මගිනි.

---

19 CAT/C/LKA/5/Add.1, 7 June 2016. 20 A/HRC/30/l.29, 1 October 2015. 21 Para 70, A/HRC/30/l.29, 1 October 2015.

**ඡේදය 6: ජාතික මානව හිමිකම් ක්‍රියාකාරි සැලැස්ම -** මානව හිමිකම් ආරක්ෂා කිරීම සහ නගාසිටුවීම සඳහා වන නව ජාතික ක්‍රියාකාරී සැලැස්ම (NHRAP). පූර්ව විමසීමකින් තොරව NHRAP කමිටු සඳහා පත් කරන ලද[22] බවට ප්‍රසිද්ධ කෙරුනු ප්‍රවීණ සහ ගෞරවයට පාත්‍රවූ මානව හිමිකම් නීතිවේදීන් කිහිපදෙනකුම අප දන්නා පරිදි එම තනතුරු භාර ගැනීම ප්‍රතික්ෂේප කර තිබේ. ඊට හේතුව ලෙස දක්වා ඇත්තේ ක්‍රියාවලියේ විශ්වසනීයත්වය පිළිබඳව පිළිගැනීමක් නැති කමයි. ඊටත් අමතරව, අතිරේක සොලිසිටර් ජනරාල් යසන්ත කෝදාගොඩ මහතා NHRAP "වධහිංසනය වැලැක්වීම" කෙටුම්පත් කිරීම සඳහා වන කමිටුවේ ප්‍රධානත්වයට පත් කිරීම සමස්ත ප්‍රයත්නයම අනතුරේ හෙලන්නකි. රාජපක්ෂ ආණ්ඩුව වෙනුවෙන් වැඩ කරද්දී බරපතල මානව හිමිකම් අපරාධ වසං කිරීම නිසා මෙම ජ්‍යෙෂ්ට රජයේ නීති නිලධාරියා ගේ අවංකකම සහ අපක්ෂපාතී භාවය පිලිබඳ බරපතල ගැටළු මතුවී තිබේ. මේ ගැටළු ආසියානු මානව හිමිකම් කොමිසම විසින් ජනමාධ්‍ය ඔස්සේ මතු කරන ලද්දේ පමණක් නොව, ජාත්‍යන්තර ස්වාධීන අද්විතීයයන්ගේ කණ්ඩායම (IIGEP) ට අරමුදල් දුන් දායකයන් ට සපයන ලද ITJP විසින් දකින ලද රහස්‍ය වාර්තාවකත්[23] සඳහන් වෙයි.

**ඡේදය 10: සාක්ෂිකරුවන්ගේ ආරක්ෂාව -** අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ 2015 අංක 4 දරන පනත සම්මත කර ගැනීම ආණ්ඩුව විසින් පෙන්වා දෙනු ලබන්නේ ප්‍රගතියේ සලකුණක් ලෙසය. කෙසේවෙතත්, මේ පනත බරපතල දෝෂයෙන් ගහන බවටත් ප්‍රතිශෝධනය කළ යුතු බවටත් ශ්‍රී ලංකාව තුලත් ඉන් පිටතත් සිවිල් සමාජ කණ්ඩායම් අතර එකඟතාවක් පවතී[24]. ස්වාධීන නොවන බවටත්, මුළුමනින්ම අවිශ්වසනීය බවටත් පිළිගැනෙන කලින් සඳහන් යසන්ත කෝදාගොඩ මහතා වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වන ජාතික අධිකාරියටත් ඇතුලත් කොට ඇති බව මාධ්‍ය විසින් වාර්තා කොට ඇත[25].

**ඡේදය 25: ත්‍රිකුණාමලය -** ත්‍රිකුණාමල රහසිගත නාවික වධකාගාරය පිළිබඳව තවදුරටත් පරීක්ෂණ පවත්වන බව ශ්‍රී ලංකා රජය පැවසුවත්, මේ වනතුරු ඒ සම්බන්ධයෙන් කිසිදු තොරතුරක් ප්‍රසිද්ධියට පත් කර නැත. එය පිහිටා ඇති ස්ථානයේ නිශ්චිත GPS දත්ත දිවි ගලවා ගත් අයගේ සාක්ෂි මත පදනම් වී ITJP විසින් සම්පාදනය කළ සිය 2015 ජූලි වාර්තාවේ ප්‍රසිද්ධ කර තිබේ. බලහත්කාරයෙන් හෝ නොකැමැත්තෙන් හෝ අතුරුදහන් කරනු ලැබුවන් සම්බන්ධ එක්සත් ජාතීන්ගේ ක්‍රියාකාරී කමිටුව එම ස්ථානය බලන්නට ගිය අවස්ථාවේ ශ්‍රී ලංකාවේ රජය විසින් ගත යුතුව තිබූ පියවර මාලාවක්ද ITJP විසින් ප්‍රකාශයට පත් කරන ලදී (අමුණා ඇත).

පාරදෘශ්‍යභාවය සහ විවෘත භාවය විදහා දක්වනු සඳහා නාවික හමුදා ප්‍රධානියා විසින් පැමිණි නිලධාරීන් සමහර භූගත ස්ථාන වලට කැඳවාගෙන යන ලද බව ITJP වෙත දැනුම් දෙනු ලැබුනි. කෙසේවෙතත්, මේ 'සංචාර' අනුමත කළ නොහැකි වන්නේ වෝහාරික සාක්ෂි දූෂ්‍ය විය හැකි හෙයිනි. ඊට අමතරව, මේ 'සංචාර' මෙහෙයවනු ලබන්නේ පරිශ්‍රය පවත්වාගෙන යාමෙන් අපරාධ සහායකත්වයක් දරා තිබෙනු ඇති නාවික නිලධාරීන් විසිනි.

---

22 Drafting “The National Action Plan for the Protection and Promotion of Human Rights (2017-2021)”. 23APPOINTMENT OF YASANTHA KODAGODA TO TORTURE COMMITTEE OF HRC-SL INAPPROPRIATE – AHRC, Sri Lanka Brief, 22 September 2016, Accessed at http://srilankabrief.org/2016/09/appointment-of-yasantha-kodagoda-to-torture-committee-of-hrc-sl-inappropriate-ahrc/ 24 The Draft Bill for the Assistance and Protection of Victims of Crime and Witnesses: Critique and Recommendations, Rosalind Sipos, CPA, Accessed at https://cpalanka.org/wp-content/uploads/2007/10/_and_Witness_Protection_Bill.pdf 25“NA for protecting victims and witnesses set up”, 8 January 2016, Ceylon Times, no longer available online, it says the appointments include: Hamid Ghazali Hussain, Additional Solicitor General, Yasantha Kodagoda, Additional Secretary to the Ministry of Law and Order, Neel Hapuhinne, Senior Assistant Secretary to the Ministry of Women and Child Affairs, W.U.P. Premachandra and Senior Deputy Inspector General of Police (Crimes and Motor Vehicle/Traffic) Nandana Munasinghe). The chairperson was the retired High Court Judge Wimal Nambuwasam. Other members include Senior Lecturer at the Department of Public and International Law at the Faculty of Law, the University of Colombo, Dr. M.A.D.S.J. Shiranjani Niriella, Dr. Nimal Fernando, Deputy Inspector General of Police, Ashoka Wijethilake and Attorney-at-Law Sanjeewa Samaranayake. The Chair resigned from the position within a few months of appointment and was succeeded by Solicitor General Suhada Gamlath. It was further found that there was a legal defect in the appointment of the members necessitating re-appointment several months after the body was established. The negative impact on the credibility of the Authority was considerable.

ත්‍රිකුණාමල රහසිගත කඳවුරේ රැඳවියන් භාරව සිටි බවට චෝදනා ලබන නාවික හමුදා නිලධාරීන් දෙදෙනකුද ITJP විසින් තම 2015 ජූලි වාර්තාවෙන් නම් කරන ලදී (රණසිංහ සහ වෙලගෙදර). වධහිංසා කිරීම සහ ලිංගික ප්‍රචණ්ඩතා වලට සම්බන්ධ බවට චූදිත අපරාධ කරුවන් සේ සැකකෙරෙන මුර සෙබළුන්ගේ සහ ප්‍රශ්න කරන්නන්ගේ නම් සහ ඡායාරූප තමන් සතුව ඇති බවද ITJP විසින් ආණ්ඩුවට දැනුම් දෙන ලදී. විශ්වසනීය පරීක්ෂණයක් පැවැත්වෙන්නේ නම් ඒවා අනාවරණය කිරීමටත් ITJP කැමැත්ත පල කළේය. මේ තොරතුරු තිබියදීත්, ශ්‍රී ලංකා රජය ඒ ඔස්සේ හඹා ගියේ නැත. ITJP විසින් නම් කරන ලද එක් අයකු වන කොමදෝරු වෙලගෙදර කොළඹදී පැහැරගන්නා ලද පාසල් සිසුන් ට අදාළව ත්‍රිකුණාමල පරිශ්‍රය හා ඈඳුනු නඩුවක සාක්ෂි කරුවකු වන නමුත්, 2009-2012 වකවානුවේ හිටපු එල්ටීටීඊ සාමාජිකයන් 75 දෙනකු පමණ භූගත කඳවුරේ රඳවා තබා ගැනීමේදී[26] ඔහු දැරූ භූමිකාව සම්බන්ධයෙන් පරීක්ෂණයට ලක් නොවී සිටීම විශ්මය ජනකය.

**ඡේදය 33: මාධ්‍යවේදීන් -** ආණ්ඩුව මෙසේ කියයි: "මාධ්‍යවේදීන්ට එරෙහි *සියලු අතීත අපරාධ* විභාග කර, මාධ්‍යවේදීන්ට හෝ වෙනත් මාධ්‍ය නිලධාරීන්ට එරෙහි ප්‍රහාර සම්බන්ධයෙන් චෝදනා ලබන ඕනෑම අයකුට අපරාධ නීතිය යටතේ සුදුසු තන්හිදී කටයුතු කිරීම සඳහාද ආණ්ඩුව පියවර ගෙන තිබේ."

මෙය කිසිසේත් සත්‍යයක් නොවේ. ඝාතන සහ පැහැරගැනීම් සහ ප්‍රහාර ගණනාවක ලැයිස්තු මාධ්‍ය සංවිධාන විසින් එකතු කර තිබුනත්, මෙයින් තොගයක්ම සම්බන්ධයෙන් කිසිදු පරීක්ෂණයක් සිදුකර නැත. කිසිදා නිසියාකාර විමර්ශනය නොකළ ප්‍රසිද්ධ ඝාතන නම් කළොත්: නිමලරාජන් මයිල්වාගනම් (බීබීසී), ධර්මරත්නම් සිවරාම් (ටැමිල්නෙට්) සහ ඉසෙයිප්‍රියා (පුලිගල් කුරල් රූපවාහිනිය).

**ඡේදය 41: වධහිංසා පිළිබඳව පැමිණිලි කිරීම -** රජය මෙසේ කියයි: "පොලිසියේ කටයුතු සහ අඩුපාඩු සම්බන්ධයෙන් පැමිණිලි කිරීමට මහජනතාවට අනුබල දීම සඳහා පොලිස් මූලස්ථානය සෑම සිකුරාදාම මහජන දිනයක් පවත්වයි".

ආරක්ෂක අංශ කෙරේ විශ්වාසයක් නැති කමත්, පලිගැනීම් සහ එකටෙක කිරීම් පිළිබඳ බිය මෙන්ම පොලිසියම උල්ලංඝන වලට දායක වී තිබීමත් නිසා අපරාධකරුවන් බව හැඟී යන පුද්ගලයන්ට එරෙහිව පැමිණිලි කරන්නට කෙලෙසීම් වලට ගොදුරු වූවන් ඉදිරිපත් වීමේ ඉඩකඩ ඉතා අඩුය. මේ ප්‍රවේශය සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම පිළිබඳ කිසිත් නොදැනීම අඟවන රැවටිල්ලක් වන අතර එය මහත් කම්පා කරවන සුළුය.

**ඡේදය 42: විමර්ශනය -** ආණ්ඩුව මෙසේ කියයි: "වධහිංසා පිළිබඳ පැමිණිලි සම්බන්ධයෙන් වහාම පරීක්ෂණ ආරම්භ කිරීමේ වරම සතු පොලිස් විශේෂ විමර්ශන ඒකකයක් (SIU) ඇත. මේ පරීක්ෂණ නීතිපති දෙපාර්තමේන්තුව යටතේ ඇති වධහිංසා කළ අපරාධකරුවන්ට දඬුවම් කිරීමේ ඒකකය (PTP) විසින් අධීක්ෂණය කරනු ලැබේ.

මේ රාජ්‍ය හමුදා විසින් වධබන්ධනයට පත් කරන ලද පීඩිතයන්ගේ විශ්වාසය දිනා ගැනීමෙහි සමත් ස්වාධීන සහ පිළිගත හැකි ක්‍රියාදාමයක් නොවේ. IIGEP විමර්ශන වලදී නීතිපති දෙපාර්තමේන්තුව දැක්වූ සබැඳියා ගැටුම අතීතයේ මැනවින් වාර්තා වී තිබේ[27].

**2. "ප්‍රඥප්තියේ 19 වැනි වගන්තිය ප්‍රකාර රාජ්‍ය පාර්ශව විසින් ඉදිරිපත් කරන ලද වාර්තා සම්බන්ධයෙන් සලකා බැලීම"(2016 දෙසැම්බර්) හි ආණ්ඩුව විසින් මතු කළ ඇතැම් කරුණු වලට ප්‍රතිචාර[28].**

**ඡේද 108-111: හයිටි එක්සත් ජාතීන්ගේ සාම සාධක හමුදාව -** මේ ඡේද වලින් කියැවෙන්නේ එක්සත් ජාතීන්ගේ සාම සාධක සෙබළුන් ලෙස හයිටියේ සේවය කළ ශ්‍රී ලංකා යුද හමුදා භටයන් 114ත් 117[29]ත්

---

26 Victims and witnesses: No protection, but persecution, By Namini Wijedasa, The Sunday Times Lanka, 31 July 2016, Accessed at http://www.sundaytimes.lk/160731/news/victims-and-witnesses-no-protection-but-persecution-202919.html 27 See ITJP report Annex http://www.itjpsl.com/wp-content/uploads/2015/07/Stop-Torture-Annexes-III.pdf which is the IIGEP report. 28 CAR/C/LKA5, 11 December 2015. 29 Conduct and Discipline in UN Peacekeeping Operations: Culture, Political Economy and Gender  Report submitted to the Conduct and Discipline Unit Department of Peacekeeping Operations United Nations, October 19, 2009, Catherine Lutz, Matthew Gutmann, and Keith Brown Watson Institute for International Studies Brown University, accessed at http://watsoninstitute.org/images_news/un_report_2009_10_19.pdf

අතර කණ්ඩායමක් "නිරන්තරයෙන් සහ බොහෝවිට රාත්‍රියේ මෙන්ම, බලඇණියේ නිලධාරීන් යොදවා තිබූ සෑම තැනකම පාහේ"[30] පිරිමි සහ ගැහැණු දරුවන් ලිංගික දූෂණය කිරීමේ චෝදනා වලට 2007 දී පෙරලා ඒමත්, පිටුවහල් කිරීමත් සම්බන්ධ වාර්තා ගැනය. ශ්‍රී ලංකා සාම සාධක හටයන් භාණ්ඩ හුවමාරුවට ලිංගික සේවනයේ යෙදීම ඉතා බහුල ලෙසින් පැතිර පැවති බවත්[31], ඔවුන් බාලවයස්කාර දරුවන්ට ජංගම දුරකථන දෙමින් ගණිකා ජාලයක් පවත්වාගෙන ගිය බවත්, වාර්තාවලින් කියැවේ. එම දුරකථන අංක අලුතින් එන බලඇණි අතට පත් කරනු ලැබේ. මේ ගනුදෙනු හේතුවෙන් ලාබාල කාන්තාවෝ කිහිප දෙනෙක්ම ගැබ් ගත්හ. අපේ වැටහීම අනුව 2004 අග සිට 2007 ඔක්තෝබර් මැද දක්වා කාල පරිච්ඡේදය තුල, වර්තමාන සහ කලින් සිටි ශ්‍රී ලංකික බල ඇණි වල හමුදා සාමාජිකයෝ අඩුම තරමින් 134 ක් හයිටි දරුවන් ලිංගික සූරා කෑමටත්, අපහරණයටත් ගොදුරු කරගැනීමේ චූදිතයෝය. එවන් අපරාධ සම්බන්ධයෙන් වගකිවයුත්තන්ගේ වගවීම පිළිබඳව ශ්‍රී ලංකා රජය කිසිදු පියවරක් ගත්තේද යන්න පැහැදිලි නැත.

108 සිට 111 දක්වා වන ඡේද වල වලංගු බව පිළිගැනීමට පෙර මේ ප්‍රශ්නය නිරාකරණය කිරීම සඳහා හයිටි සිදුවීම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ අභ්‍යන්තර අධීක්ෂණ සේවා කාර්යාලයේ (OIOS) විමර්ශන වාර්තාවේ පිටපතක් ඉල්ලා ගන්නා ලෙස ITJP කමිටුවට නිර්දේශ කරයි. ඒ පහත දැක්වෙන කාරණා නිසාය.

අ) "වරදේ බැරෑරුම්කම අනුව දණ්ඩනීය පියවර" ගන්නා ලද බව ශ්‍රී ලංකා ආණ්ඩුව කියා සිටී. එහෙත් වරද කුමක්දැයි දක්වා ඇති OIOS වාර්තාව නොකියවා එම ප්‍රකාශයේ සත්‍යතාව තහවුරු කරගත නොහැක.

ආ) ශ්‍රී ලංකා ආණ්ඩුව කියන්නේ නිලධාරීන් 10 දෙනකුට සහ සොල්දාදුවන් 13 දෙනකුට එරෙහිව විනය පියවර ගත බවයි. (3ක් යුද්ධයේදී මියයාමෙන් පෙනී යන්නේ ශ්‍රී ලංකාවට පැමිණි පසු 2007-2009 කාලය අතරතුර ඔවුන්ට එරෙහිව කිසිදු විනය පියවරක් ගෙන නැති බවයි.) එහෙත් ඉතිරි 91 දෙනා නිදොස් කළේ ඇයිද යන්නත්, එසේ වරදින් නිදහස් කිරීමේ පදනම කුමක්ද යන්නත් පැහැදිලි නැත.

ඇ) එක් නිලධාරියකුට එරෙහිව විනය පියවර ගන්නා ලද බවත්, ඔහු ධුරයෙන් පහතට හෙලන ලද බවත් ශ්‍රී ලංකා ආණ්ඩුව කියයි. තවත් අයකුට ඔහු දැරූ ඉහල නිලයේම විශ්‍රාම ගන්නට ඉඩදී තිබේ. එක් සොල්දාදුවකු සේවයෙන් පහ කර ඇත. හයිටි දරුවන් සංවිධානගතව දූෂණය කිරීමේ දී දැරූ භූමිකාව සම්බන්ධ චෝදනා වලට ඔවුන් සිරගත කොට සිටි බවක් එමගින් පෙන්නුම් කෙරෙන්නේ නැත. අපරාධ සම්බන්ධ කිසියම් දඬුවමක් දෙන ලද්දේද? එසේ නොවී නම් ලිංගික හිංසනය වැළැක්වීමේ ව්‍යායාමය (PSVI) ට ශ්‍රී ලංකාව අත්සන් තැබීම සමගින් මෙය සැසඳෙන්නේ කෙසේද? හයිටියේ ලිංගික හිංසනයේ පීඩිතයන්ට ශ්‍රී ලංකා රජය කිසියම් හානිපූරණයක් හෝ වන්දි ගෙවීමක් කළේද?

ඈ) මේ සොල්දාදුවන් අනාගත මෙහෙයුම් වලින් ඉවත් කර තැබීමට පියවර ගෙන ඇති බව 111 ඡේදයෙන් කියැවේ. මහ ලේකම් වරයාගේ "කිසිසේත් ඉඩ නොදීමේ" ප්‍රතිපත්තියත්, සාමසාධනයට සෙබළුන් යවන රටවල් විසින්ම සුලමුල සෙවීම හා සුපරීක්ෂණය කිරීමට ඉඩ සලසා තිබීමත් ගත් කල මෙය සිදුවීමට තිබෙන ඉඩකඩ ඉතා අල්පය. හයිටි සිද්ධියේදී වරදට සම්බන්ධ බවට ප්‍රකාශිත සොල්දාදුවන්ගේ නම් මේ වසරේ මාලි බලා යාම සඳහා ආණ්ඩුව විසින් දී තිබෙන ලැයිස්තුවේ තිබේදැයි එක්සත් ජාතීන්ගේ සාම සාධක මෙහෙයුම් කාර්යාංශයෙන් සහ ශ්‍රී ලංකා රජයෙන් විමසා, එසේ සිටී නම්, ඔවුන් මෙහෙයුමකට යවන්නට පෙර ඉවත් කිරීම සඳහා කවර පියවර ගෙන ඇතිදැයි විමසන ලෙස ITJP කමිටුවට යෝජනා කරයි. ලිංගික ගොදුරු සොයන්නන් සහ දූෂකයන් සාම සාධක හමුදා වලට ඇතුලත් නොවීම සහතික කිරීමේ වගකීම මුළුමනින්ම ඇත්තේ එක්සත් ජාතීන්ගේ සංවිධානය සහ ශ්‍රී ලංකා රජය යන දෙකම අතය. අපට දැනගන්නට ලැබී තිබෙන පරිදි, එක්සත් ජාතීන්ගේ සාම සාධක හටයන් ලෙසින් ශ්‍රී ලංකාවෙන් යවන්නට ගිවිසගෙන ඇති සෙබල මුළුව 3,500 කි.

හයිටියෙන් පිටුවහල් කෙරුනු හට පිරිස් සම්බන්ධයෙන් තමන් විසින් ප්‍රකාශයට පත් කරන ලද පියවර ගන්නා ලද ආකාරය තහවුරු කිරීම සඳහා විනය පරීක්ෂණ සහ යුද්ධාධිකරණ විභාග ක්‍රියාමාර්ගද ඇතුලත් වාර්තා ලබාදෙන ලෙස ශ්‍රී ලංකා රජයෙන් ඉල්ලා සිටින මෙන් ITJP කමිටුවට නිර්දේශ කර සිටී.

---

30 UN confirms sex charges: 114 Lankan troops in Haiti involved in child abuse, 31 March 2008, Sunday Times Lanka, Accessed at http://www.lankanewspapers.com/news/2008/3/26245_space.html 31 United Nations in Haiti, Kathie Klarreich, Accessed at http://www.kogainon.com/100Reporters/HAITI/Title.html

**ඡේදය 9: ව්‍යාප්ත.** ආණ්ඩුවේ ලියැවිල්ලේ මෙසේ සඳහන් වෙයි: "වධහිංසා කිරීම තවමත් ව්‍යාප්තව සහ දඬුවම් ලැබීමෙන් තොරව සිදු කෙරෙන බවටත් එල්ලවන චෝදනා ශ්‍රී ලංකාවේ රජය ප්‍රතික්ෂේප කරයි. විශ්වසනීය සාක්ෂි ලැබෙන හැම අවස්ථාවකදීම, පියවර ගෙන තිබේ...".
මේ ප්‍රකාශනය ගැටළු සහගතය. ඒ පහත දැක්වෙන කරුණු නිසාය:

අ) මේ ප්‍රකාශනය එක්සත් ජාතීන්ගේ විමර්ශන වාර්තාවේ සොයාගැනීම් වලට පටහැනිය. ඊට අමතරව, දැනට පවතින සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීමේ ප්‍රතිපාදන නොමැති වීම, විදේශගතව සිටින වින්දිතයන්ගේ පවුල් වලට එරෙහිව දැන් සිදුවන හිරිහැර සහ බියවැද්දීම් හා රටින් පිටත සිටින පීඩිතයන්ට සහ සාක්ෂිකරුවන්ට වීඩියෝ සම්බන්ධයක් ඔස්සේ සාක්ෂි දීම සඳහා ආරක්ෂිත යාන්ත්‍රණයක් නොමැති වීම නිසා ශ්‍රී ලංකාවේ ආණ්ඩුවට සමග සාක්ෂි ලබා දීම කළ නොහැකි කටයුත්තකි.

ආ) දිවි බේරාගෙන පැමිණ විදේශගතව සිටින 200 කින් පමණ ITJP සවිස්තර ප්‍රකාශන ලබාගෙන තිබේ. මින් බොහොමයක් වධහිංසාවෙන් නිදහස (Freedom From Torture) සංවිධානයේ සගයන් විසින් විමර්ශනය කරන ලද සිය ගණන හෝ හියුමන් රයිට්ස් වොච් (HRW) 2013 සම්පාදනය කළ වාර්තාවේ එන 75 හා එකපිට එක වැටෙන්නේ නැත. ශ්‍රී ලංකා පොලිසිය විසින් පශ්චාත් යුද සමයේ කරන ලද වධහිංසා 30ක් ගැන 12 ඡේදයේ සඳහන් වෙයි. මෙය විකාර සහගතය.

**ඡේද 13-14:** රැඳවියන්ගේ සුරක්ෂිත භාවය වෙනුවෙන් වැඩපිළිවෙල යොදා ඇතැයි ආණ්ඩුව තදින් කියා සිටියද, ශ්‍රී ලංකා ආරක්ෂක අංශ විසින් නීති විරෝධී පැහැරගැනීම් සහ වින්දිතයන්ට නීතිඥයන්, වෛද්‍ය පහසුකම්, හබයාස් කෝපුස් ආඥා, ජාත්‍යන්තර රතු කුරුස සංවිධානය හෝ විනිසුරුවන් ගේ පිහිටක් නොමැතිව සිරකොට තබා ගන්නා නොනිල රහසිගත රැඳවුම් ස්ථාන දිගටම පවත්වාගෙන යන බවට විශ්වසනීය සාක්ෂි ලැබී තිබේ.

ශ්‍රී ලංකා රජය 2015 දී කමිටුවට දුන් ලියවිල්ලේ සඳහන් වන්නේ රහසිගත වධකාගාර ඇතිදැයි ඔවුන් විසින් කරනු ලබන "විමර්ශන අවසන් වූ පසු වැඩි විස්තර ලබා දිය හැකි" බවයි. කිසිදු රහසිගත වධකාගාරයක් නැතැයි ආණ්ඩුව සිය 2016 ජූනි ලියවිල්ලේ සඳහන් කරයි. එහෙත්, එම තීන්දුවට එළැඹුනේ කෙසේදැයි විස්තර සපයන්නේ නැත.

**ඡේදය 15: බලහත්කාර අතුරුදහන් කිරීම්:** හමුදා අත් අඩංගුවේ සිටියදී 2015 සිදුවූ අතුරුදහන් වීමක් ගැන ITJP දනියි. නිල පැමිණිල්ලක් කිරීමට මහත් බියෙන් පසු වෙන ඥාතීන්ට, අවසරලත් රැඳවුම් ස්ථාන කරා යාමට ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිසමට අලුතින් දී ඇති බලතල සම්බන්ධයෙන් උපදෙස් දී තිබේ.

**ඡේදය 37:** 'පුනරුත්ථාපනය' සඳහා නිර්දේශිත රැඳවියන්ගේ සංඛ්‍යාව දක්වා සිටියත්, දැනට ඉන්නාවූ හෝ මේ වනවිට එයින් මුදාහැර ඇත්තාවූ හෝ පිරිස සඳහන් නොවේ.

**ඡේදය 59:** ආණ්ඩුව මෙසේ කියයි: "වධහිංසාවෙන් ගැලවුනු ඕනෑම අයකුට, නිදහස් කළ පසු මේ වනවිට ඕනෑම ආණ්ඩුවේ රෝහලකට හෝ කොළඹ ප්‍රධාන පුද්ගලික රෝහලකට ඇතුල් විය හැකිය."

බොහෝ හිටපු එල්ටීටීඊ සාමාජිකයන් ශ්‍රී ලංකාවේ උතුරු නැගෙනහිර රෝහල් වලින් පිටතදී අතීතයේදී රඳවා තබා ගන්නා හෝ පැහැරගන්නා ලද බව ITJP සටහන් කරයි. රෝහල් වලට වාර්තා කිරීම ඔවුන්ට ආරක්ෂා කාරී  වූයේ නැත.

**ඡේදය 60:** ආණ්ඩුව මෙසේ කියයි: "වෛද්‍ය නෛතික පරීක්ෂාවට භාජන කරන ලද සියලුම රෝගීන්ට වෛද්‍ය නෛතික වාර්තාවක් (MLR) හෝ අධිකරණයට යවන ලද එහි පිටපතක් ලබා ගැනීමේ අයිතියක් ඇත. වාර්තාවක් අධිකරණයට ලබා දීමෙන් අනතුරුව එය ප්‍රසිද්ධ ලියැවිල්ලක් බවට පත්වේ...".

MLR වාර්තාව ප්‍රසිද්ධ ලියැවිල්ලක් වීම පිළිබඳව ITJP පුදුම වෙයි. එයින් සිදුවන්නේ ලිංගික ප්‍රචණ්ඩතා වලට ගොදුරුවූ පීඩිතයන් ගේ අනන්‍යතාව හෙළිදරව් වී ඔවුන් මහත් අනතුරේ වැටීමයි. ශ්‍රී ලංකා සන්දර්භය තුල ලිංගික ප්‍රචණ්ඩතාවට ගොදුරු වූවන්ගේ අනන්‍යතාව රැකීමේ පියවර ස්ථාපිත කරන ලෙස ආණ්ඩුවෙන් ඉල්ලා සිටිය යුතුය.

**ඡේදය 149: පිළියම් -** ITJP ගනුදෙනු කරන්නේ වධහිසාවට ගොදුරු වී විදෙස්ගත වුවන් සමගය. ඔවුන්ට රටහැර යන ලෙස බොහෝවිට කියා ඇත්තේ ආරක්ෂක අංශ විසිනි. ශ්‍රී ලංකාවේ සේවා වලට ප්‍රවේශ වීමේ මාර්ගයක් ඔවුන්ට නැත. කිහිප වර රඳවා තබාගනු හා වද දෙනු ලැබුවන් පවා රට තුල සිටියදී මේ සේවා

ලබා ගැනීමට ගොස් නැත්තේ පලිගැනීමට ලක්වීමේ බියෙනි. යුද්ධයෙන් හා වධහිංසාවෙන් දිවි ගලවාගෙන පිටරටවලට පැමිණෙන්නන් අලුත් කෘතිම අවයව නොලබා, ස්නායු හානි සහ පිපිරුම් තුවාල සඳහා ශල්‍යකර්ම නොලැබ, කිසිදු මානසික වෛද්‍ය ප්‍රතිකාරයක් නැතිව හිඳිනු අපි නිරන්තරයෙන් දැක ඇත්තෙමු.

**ඡේදය 150:** ශ්‍රී ලංකා ආණ්ඩුව විස්තර කරන්නේ වධහිංසාව නිරන්තරයෙන් සිදු කරන ස්ථාන වල තමන් රඳවා තබා ගැනීමට එරෙහිව අභියාචනයක් කිරීමේ හෝ කිසිදු අයිතියක් නැතිව ඉන්නා අයට ලබාදෙන රැකියා පුහුණුවක් ගැනය. මෙය පුරසාරම් දෙඩීමට තරම් කාරණයක් නොවේ.

**නිර්දේශ**

**වධහිංසාවට එරෙහි කමිටුව විසින් පියවර ගැනීම සඳහා**

i. සුදු වෑන් පැහැර ගැනීම්ද ඇතුළුව නීති විරෝධී රඳවා තබාගැනීම්, වධබන්ධන, නඩු නැති ඝාතන සහ ලිංගික ප්‍රචණ්ඩතා සම්බන්ධ චෝදනා පිළිබඳව කරන ලද විමර්ශන පිළිබඳ සියලු වාර්තා කමිටුවට ලබා දෙන ලෙස ආණ්ඩුවෙන් ඉල්ලීම.
ii. සුදු වෑන් පැහැරගැනීම් හා ඊට අනුබද්ධ වධහිංසා සහ ලිංගික ප්‍රචණ්ඩතා මෙන්ම කප්පම් ගැනීම් සහ ජාවාරම් පිළිබඳ ස්වාධීන පරීක්ෂණයක් ඉල්ලා සිටීම.
iii. හයිටි සිද්ධි (2007 සහ ඉන් පසුව 2013) සම්බන්ධයෙන් නම් කරන ලද ආරක්ෂක හමුදා නිලධාරීන් පිළිබඳ පරීක්ෂණ වලට අදාළ සියලු වාර්තා මෙන්ම, ආණ්ඩුව විසින් පවත්වනු ලබන සුලමුල සෙවීම් සහ සුපරීක්ෂණ ක්‍රියාදාමයේ විස්තර කමිටුවට ලබා දෙන ලෙස ඉල්ලීම.
iv. නීති විරෝධී පැහැරගැනීම්, දූෂණ සහ ලිංගික ප්‍රචණ්ඩතා පිළිබඳ වාර්තා සම්බන්ධයෙන් නීතිපති දෙපාර්තමේන්තුව විසින් පවරන ලද නඩු පිළිබඳ වාර්තා කමිටුවට ලබා දෙන ලෙස ඉල්ලීම.
v. එවැනි විමර්ශනයක් සඳහා අවශ්‍ය විය හැකි සංවේදී තොරතුරු ආරක්ෂා කිරීම සඳහා තිබෙන විකල්ප සම්බන්ධයෙන් ITJP සමග සම්බන්ධ වීම.

**ශ්‍රී ලංකා ආරක්ෂක අංශ සහ අපරාධ යුක්ති විනිශ්චය කෙරේ විශ්වාසය නැවත ගොඩනැගීමේ අත්‍යාවශ්‍ය අංගයක් වන ආරක්ෂිත භාවය තහවුරු කිරීම සඳහා ශ්‍රී ලංකා රජය පහත දැක්වෙන පියවර ගත යුතුය:**

i. වධහිංසාවට එරෙහි කමිටුව සිය පනස් හත් වැනි (2016 අප්‍රේල් 18 - මැයි 13) ප්‍රකාශයට පත් කළ "ශ්‍රී ලංකාව සම්බන්ධ පස්වැනි වාරික වාර්තාවට අදාළ කරුණු ලැයිස්තුව" විසින් මතු කරනු ලබන කරුණු සියල්ලටම වහාම පිළිතුරු ලබා දිය යුතුය.
ii. අත් අඩංගුවට ගැනීම් සහ රඳවා තබා ගැනීම් සම්බන්ධයෙන් ජාතික මානව හිමිකම් කොමිසම විසින් දී ඇති මාර්ගෝපදේශ පිළිපැදිය යුතුය.
iii. ත්‍රස්තවාදය වැලැක්වීමේ දුෂ්ට පනත අහෝසි කිරීමට වහාම පියවර ගත යුතුය.
iv. වධහිංසාවට එරෙහි සම්මුතියට අදාළ වෛකල්පික ගිවිසුම නීතිගත කොට වධහිංසාව වැලැක්වීම සඳහා ප්‍රතිපලදායක වැඩසටහනක් ස්ථාපිත කිරීම.
v. නීති විරෝධී රඳවාගැනීම්, සුදු වෑන් පැහැරගැනීම්, වධහිංසා සහ ලිංගික ප්‍රචණ්ඩතා මෙන්ම කප්පම් ගැනීම් සම්බන්ධයෙන් අණ දීමේ සහ පාලනයේ වගකීම් දරන ආරක්ෂක අංශ වල සියල්ලන්ම හඳුනාගෙන ඔවුන්ට නඩු පැවරීම මගින් වගවීම නගා සිටුවා දණ්ඩ මුක්තිය අවසන් කිරීම.
vi. අත් අඩංගුවේ ඉන්නා අය සම්බන්ධයෙන් පුනරීක්ෂණයක් කිරීම සඳහා ස්වාධීන යාන්ත්‍රණ පිහිටුවා ඔවුන් කල් පමා නොකර අධිකරණයක් හමුවට පැමිණවීමෙන් 11 සහ 12 වගන්ති යටතේ ශ්‍රී ලංකාව සතු යුතුකම් ඉටු කිරීමට පියවර ගැනීම.
vii. විනිසුරුවන්ගේ හා නීතිවේදීන්ගේ ස්වාධීනත්වය සඳහා වන එක්සත් ජාතීන්ගේ විශේෂ නියෝජිත මොනිකා පින්ටෝ සහ වධහිංසාව සම්බන්ධ විශේෂ නියෝජිත හුවාන් මෙන්දේස් විසින් මතු කරන ලද කරුණු සැලකිල්ලට ගෙන, අධිකරණ ක්ෂේත්‍රය ද ඇතුලත් ආයතනික ප්‍රතිසංස්කරණයකට එළඹෙන ලෙස කමිටුව ශ්‍රී ලංකා රජයට නිර්දේශ කළ යුතුය.

**සමාප්තිය**

නීති විරෝධී ලෙස රඳවා තබාගෙන සිටින්නවුන්ට නීතිඥයකු සහ වෛද්‍යවරයකු හමුවීමට ඇති අයිතියත්, එවැනි රඳවා තබා ගැනීමක් සම්බන්ධයෙන් පවුලේ අයට හෝ තුන්වැනි පාර්ශවයකට හෝ දැනුම් දී තිබීමට ඇති අයිතියත් භුක්ති විඳිය යුතු වීම කෙලෙසීම් වලක්වාලීම සඳහා සම්මුතිය යටතේ සපුරා ලිය යුතු අවශ්‍යතාවකි. වධහිංසාවට එරෙහි කමිටුවේ නිර්දේශ පරිදි, මේ අයිතිවාසිකම් හඳුන්වාදීම හෝ සවිමත් කිරීම සඳහා ශ්‍රී ලංකා රජය කඩිනම් පියවර ගත යුතුය. වධහිංසනය සහ වෙනත් ආකාරයේ නොමනා සැලකිලි සඳහා වගකිව යුතු නිලධාරීන් ඔවුන් කළ දේ සම්බන්ධයෙන් වගකීමට යටත් නොකරන තාක් කල් එවැනි කෙලෙසීම් තහනම් කර ලීම අඩාල වෙයි. කෙලෙසීම් පිළිබඳ චෝදනා මතු වූ වහාම, වගකිවයුත්තන් වගවීමට යටත් කිරීමද ඇතුළුව,  කඩිනම් සහ පලදායී පියවර නොගතහොත්, අපරාධකරුවන් කල් නොයවාම වටහා ගනු ඇත්තේ, තමන්ට දඬුවම් නොලබාම ගැලවී යා හැකි බවයි. එසේ නොකොට, වධහිංසනය සහ වෙනත් ආකාරයේ නොමනා සැලකිලි කිරීමට අණදෙන, අවසර දෙන, ඊට සමාව දෙන හෝ ඒ අපරාධ සිදුකරන නිලධාරීන්ගේ ක්‍රියාකාරකම් හෝ මඟ හැරීම් නීතිය හමුවට පමුණුවන්නේ නම්, එමගින් දෙනු ලබන පණිවිඩය වන්නේ එවැනි චර්යා වලට ඉඩ නොදෙන බවයි. එමගින් පැනවෙන බාධකයේ වටිනාකම හැරුනුකොට, නීතිය රක්ෂා කිරීමේ වගකීම දරන්නවුන්ද ඇතුළු කිසිවකු නීතියට ඉහළින් නො ඉන්නා බවට සහතිකයක්ද පොදු මහජනතාවටද ලැබෙනු ඇත.

ආරක්ෂක අංශ විසින් සිදු කරනු ලබන සුදු වෑන් පැහැරගැනීම් සහ පැහැරගනු ලැබූවන් දැනුත් වධහිංසාවට හා ලිංගික ප්‍රචණ්ඩතාවට ගොදුරු කර ගැනීම නීති විරෝධී මෙන්ම යම් අවස්ථා වලදී බරපතල ජාත්‍යන්තර අපරාධ ගණයේ ලා ගිණිය හැකි බව ලියා තබන්නට ITJP මෙය අවස්ථාව කරගනී. මීට අමතරව මේ සුදු වෑන් පැහැරගැනීම් ආරක්ෂක අංශ වලට මහත් ලාබදායී ආදායම් මාර්ගයක්ද වෙයි. අණදෙන සහ පාලක මට්ටමේ වගකිවයුත්තන් හඳුනාගත හැකි වන පරිදි ආරක්ෂක ක්ෂේත්‍රයේ පූර්ණ ප්‍රතිසංස්කරණයකට ශ්‍රී ලංකා රජය කැපවීමෙන් තොරව, නීතිය කොතරම් සංශෝධනය කළත් වධහිංසාව කවදාවත් නිමා වන්නේ නැත. ජාත්‍යන්තර රතු කුරුස සංවිධානයට සහ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිසමට නිල පරිශ්‍ර වලට නිර්බාධිතව ප්‍රවේශ වීමේ  අවසරය රජය විසින් ලබා දුන්නත්, රහසිගත වධකාගාර සහ රැඳවුම් ස්ථාන පවත්වාගෙන යන බව දිගටම ප්‍රතික්ෂේප කරන තාක් කල් නිමක් නැතිව කෙලෙසීම් කෙරෙනු ඇත.

සුදු වෑන් පැහැර ගැනීම්, වධබන්ධන සහ ලිංගික ප්‍රචණ්ඩතා ශ්‍රී ලංකාවේ කොයි තරම් ආයතනිකගතද, ආවේනිකද යන්න මේ වාර්තාවෙන් විශද වෙයි. මෙය තව දුරටත් ව්‍යවස්ථා සම්පාදනය හෝ ප්‍රතිපත්තිය පිළිබඳ ප්‍රශ්නයක් නොවේ. එය දේශපාලන අධිෂ්ඨානය පිළිබඳ කාරණයකි. එහිදී ආරක්ෂක සේනා නායකත්වයේ වගකීම් සහගත භාවය පරිපූර්ණ ස්වාධීන විමර්ශන සහ නඩු පැවරීම මගින් සහතික කරලීමට ඇති දේශපාලන අධිෂ්ඨානය මෛත්‍රිපාල සිරිසේන රජය විසින් විදහා දැක්විය යුතු වෙයි.

නිමයි

INTERNATIONAL TRUTH AND JUSTICE PROJECT